# ලොකොපකාරය.

මුල්ලෙරියාවේ

ගුණරතන ස්ථවිරපාදයන්වහන්සේ

විසින්

ලියනලද සන්න් සහිතයි.

ඩී. එච්. දියස්

විසින්

කොළඹ හුණුපිටියේ

ජිනාලඞ්කාරයන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී.

1899.

# සංඥාපනය.

"ලෝකෝපකාර" නම් මේ පොත ගෞරවාර්හ මුල්ලේරියාවේ ගුණරතන ස්ථවිරපාදයන් වහන්සේ විසින් ලියනලද අභිනව සන්නයකින් යුක්තකොට දානියෙල් ද සිල්වා නම් කෙනෙක් විසින් වර්ෂ 1872දී අච්චුගස්වා ප්‍රසිද්ධ කරනලද්දේය. මේ සන්නය අංචාර්‍ය බටුවන්තුඩාවේ පණ්ඩිතුමන්ගෙන් ලබනලද ගුරූපදේශානුගතව මනා සැලකිල්ලෙන් ලියනලද්දකි. මේ ප්‍රකරණයේ කර්තෘ කවිරෙක්ද යනාදිය නිශ්චය කරගැණීම උගහටයි. නමුත් එකපොතක පමණක් තිබී දකින්ට ලැබුනු මෙහි අග යොදා තිබෙන ගී දෙකක් හැටියට තොටගමුවිහාරයෙහි විසූ රණස්ගල්ලේ නම් ස්ථවිරකෙනෙක් විසින් මෙය රචනා කරනලදැයි පෙණේ.

මෙය වනාහි ගී 238කින් යුක්තකොට කාටත් තේරුම් ගතහැකි ලිහිල් භාෂාවෙන් රචනා කරතිබේ. ලෝකයාගේ සුචරිතඥනාභිවෘද්ධියට හෙතුවූ නානාප්‍රකාර අවවාද රාශියක් මෙහි ඇතුලත් කරතිබේ. උපමා උපමෙය සංසන්දනයෙන් සමලඞ්කෘතකොට රචනා කරතිබෙන පරිදි ඉතා මනොහරයි. සුභාෂිතාදි පොත්වල නොපෙණෙන උපදෙස් රාශියක්ද මෙහි යොදා තිබේ.

ග්‍රන්ථකර්තෘ ශෛවරිලීලායෙන් මේ ප්‍රකරණය කර තිබෙන බැව් පෙණේ. අවවාදඅනුශාසනා වශයෙන් හා ප්‍රස්තාවොචිත වශයෙන් ඒ ඒ කරුණු ගැන කියයුතු විවිධ අර්ථාන්විත උදාහරණ මෙම පොත භාවිතා කරන්නවුන්ට මුඛාරූඪ කරගත හැකි වේ. මේ පොත ලොකුකුඩා කාටත් ප්‍රයොජනවත් එකකි.

මෙය ආණ්ඩුවේ පාඨශාලාවලද බෞද්ධපාඨශාලාවලද භාවිතා කටයුතු පොතකි. බාලකාලයේදී ළමයින් අතට මෙබඳු අවවාදාන්විත පොත් දිම ඔවුන්ගේ ගුණනුවණ වැඩීමට හෙතු වේ. එහෙයින් මේ පොත ගුරුවරුන් විසින් තමතමන්ගේ පාඨශාලාවල ශිෂ්‍යයන්ට උගන්වනු ලැබේ නම් ශිෂ්‍යයන් සුචරිතයෙහි හොඳින් පිහිටුවා ගතහැකි වේ. දෙමව්පියන් විසින්ද තමතමන්ගේ දරුවන් අතට මේ පොත ගෙණ දිය යුතුයි.

පළමුවර මුද්‍රණය කල පොත් සියල්ල ශිඝ්‍රව විකිණීගිය බැවින් මෙකල පොත් ඕනෑකරණ අයට ලබාගැණීම් දුෂ්කරයක්ව පැවැත්තේය. ඒ බැව් සලකා ලොකාර්ථසිද්ධිය පිණිස නැවතත් මෙසේ අච්චුගස්වා ප්‍රසිද්ධ කරන්ට අදහස් කෙළෙමි.

මේවගට

*D. H. DIAS.*

5 මනාවනහිඳුවන්-අවිදුන්මැදෙහි පානඅවියන්,
අඥදනහට දපණ-ඔවුන්වත බලන්නට දෙනවැනි.

6 සුදනන් කෝපවූව-දුදනන් මිත්වූවද නොතිබේ,
මදක්කල්තිබුනත්-ඉන්වන අවැඩක් වැඩක්මනැත්.

7 රණහස රිවිසමග-දිවන්ජයගති බුදුකුරු විසින්,
තිරිසන්ව උපනත්-බෝසතුන් සිතුදෙයක් සිදුවේ.

8 රුරුමුවරදකල-මහදනකුමරු ගහින් ගොඩලා,
බඹරදුට දම්දෙසා-සුවඅබය ලැබවියේ සත්හට.

9 හැමරසයටමවැඩි-රසයෙක් නොමැතිසුරන්බුදිනේ,
ඊටත්වැඩිරසෙකි-තමා දරුවන්හැනූ සුබොජුන්.

10 දෙගුරුන්විසින් තම-දරුවන්ට දෙනනොමද දනනම්,
වියතුන් සබාමැද-ඉදිරිව ඉන්න සිල්ප දෙනුමයි.

---

5 මනාවන, ශෝභාපත්වන්නාවූ; විදුවක්, විද්‍යාවක්; අවිදුන්මැදෙහි, අපණ්ඩිතයන් මධ්‍යයෙහි; පාන; ප්‍රකාශකරන්නාවූ; අවියන්, අව්‍යක්තයා (ගේ ඒ ක්‍රියාව); අඥදනහට, අඥජනයාට; ඔවුන්වතබලන්නට, ඔවුන්ගේ මුහුනබලනපිණිස; දපණ, කැඩපත; දෙනවැනි, දානයකරන්නාමෙනි.

6 සුදනන්, සත්පුරුෂයන් (සත්පුරුෂයන්); කෝපවූව, කෝපයක්වූවත්; දුදනන්, දුර්ජනයන්; මිත්වූවද, මිත්‍රවූවත්; නොතිබේ, නොපවත්නේය; මදක්කල්, ටිකකලක්; තිබුනත්, (ඒ කෝපහා මිත්‍රභාවය)තිබුනේවිනමුත්; ඉන්වන, ඒ හෙතුවිසින් වන්නාවූ; අවැඩක්, අනර්ථයක්වත්; වැඩක්ම, අර්ථයක්මවත්; නැත්, නැත්තේය.

7 රණහස, සවර්ණහංසතෙමේ; රිවිසමග, සූර්ය්‍යයාසමග; දිවන්, ධාවනයකොටත්; බුදුකුරුවිසින්, බුද්ධාඞ්කුරහෙයින්; ජයගති, ජයග්‍රහණයකෙළේය, තිරිසන්ව, තිරශ්චීනව; උපනත්, උපන්නත්; බෝසතුන්, බොධිසත්වයන් විසින්; සිතුදෙයක්, සිතනලදදෙයක්; සිදුවේ, සිද්ධවන්නේයි.

8 රුරුමුවරදකල, (බෝසත්) රුරුමුවරජව උපන්කාලයෙහි; මහදනකුමරු, එනම්රාජකුමාරයා; ගහින් ගොඩලා, ගඞ්ගාවෙන් ගොඩදමා; බඹරදු, බ්‍රහමදත්තරජහට; දම්දෙසා, ධර්මදෙශනාකොට; සත්හට, ලොකසත්වයාට; සුවඅබය, සැපඅභානිභීය; ලැබවියේ, ලැබවූයේය.

9 සුරන්, දෙවියන්; බුදිනේ, අනුභවකරන්නේ; හැමරසයටම, සියලුම ආමිසරසයන්ට; වැඩි, අධිකවූ; නොමැති, දුලභවූ; රසයෙකි, රසයක්මය; තමාදරුවන්, තමන්ගේ දරුවන්විසින්; හැනූ, අනනලද්දවූ; සුබොජුන්, මනාභොජනය; ඊටත්වැඩි රසෙකි, ඒ දිවබොජුනටත්වැඩි රසයෙකි.

11 සඳනදකැත් සඳුන්-නොවද හැමකල් සිසිල වනුමෙන්,
උතුම් සිසිලයෙකි-තතෙයි තමදරුවන් වැකෙන වා.

12 දෙගුරුන්ටත්වඩා-දරුවන්ටමයි·දනෝ සෙනෙහස,
මෙලොවත් රැක මළත්-සගමොක් දෙන බැවින් කරව් පින්.

13 සාව අපබෝසත්-සක්බමුණාට දෙනුව ඇඟමස්,
පිනුසඳ ගින්නට-සුරිඳු ගෙණ සඳමැදෙහි ඇන්දේ.

14 මුනිඳුන්ගුණමහිම-මේලොවම දූනෙයි නිදිගත්විට,
යක්බූ ඔබාගත-සුගත සිහිකළ බිය බැහැරයේ.

15 ඉසුරෙන් පිරිගුණන්-සුදනෝ තමන් ගුණ අඩුනොකෙරෙති,
බිඳුනත් රන් බඳුන-ඇති බරඅගය අඩුනොවන මෙනි.

---

10 දෙගුරුන්විසින්, දෙමව්පියන්විසින්; තම්දරුවන්ට,තමන්ගේ දරකයන්ට; දෙන, දනාකටයුතුවූ;නොමද,බොහෝවූ; දනනම්, වස්තුවනම්; වියතුන්, ව්‍යක්තයන්ගේ; සබාමැද; සභාමධ්‍යයෙහි; ඉදිරිව, අභිමුඛව; ඉන්ට,හිඳීමපිණිස;සිල්ප,ශිල්පයන්;දෙනුමයි,දීමමැයි·

11 සඳනදකැත්, චන්ද්‍රයාගේආද්‍රරශ්මියද; සඳුන්,චන්දනයද; හැමකල්,සියලුකාලයෙහි; නොමද, අමන්දවූ;සිසිලවනුමෙන්, සීතලවන්නාසේ; තම දරුවන්, තමන්දරකයන්ගේ; තතෙයි, තාන්තෙසියතා; වැකෙන, කණෙහිවැටෙන;වා, වචනය;උතුම්,උත්තමවූ; සිසිලයෙකි, සීතලයෙකි.

12 දෙගුරුන්වත්වඩා, දෙමව්පියන්ටත් වැඩිකොට; දනෝ, ජනයෝ; සෙනෙහස, සෙනහය, දරුවන්ටමයි, දරකයන්ටමය; මෙලොවත්, මේලොකයෙහින්; රැක, රක්‍ෂාකොට;මළත්,මැරුණත්; සගමොක්, ස්වර්ගමොක්‍ෂදෙක; දෙනබැවින්, දනයකරණහෙයින්; පින්, පුණ්‍යදායකවූ ගරුචරණපරිචරියාව; කරව්,(කම්පලඅදිහා)කරව්.

13 අපබෝසත්, අපගේ බොධිසත්වයන්වහන්සේ; සාව,සසකයොනියෙහිඋපද; ඇඟමස්, ශරීරමාංසය; සක්බමුණාට,(බ්‍රාහ්මණවේශයෙන් දන්ඉල්ලාආ) ශක්‍රබ්‍රාහ්මණයාට; දෙනුව, දෙනුපිණිස; ගින්නට, වහ්නියට; පිනුසඳ, පැන්නකල්හි; සුරිඳු, ශක්‍රතෙමේ; ගෙණ, ග්‍රහණයකොට, සඳමැදෙහි· චන්ද්‍රමඬල.මධ්‍යයෙහි, ඇන්දේ, (සසකරූපය) අඳිනකළේයි.

14 මුනිඳුන්, මුනීන්ද්‍රාත්තමයාගේ; ගුණමහිම, ගුණමහත්බව; නිදිගත්විට, නිද්‍රොපගතකල්හි; මෙලොවම, මේලොකයෙහිම; දූනෙයි, දූනගතහැකිවෙයි; යක්බූ, යක්‍ෂභූතයන්; ඔබාගත,(නිද්‍රාවටපැමිනිකල සවපනයෙන්) ඔබාගත්කල්හි; සුගත, සර්වඥයන්; සිහිකළ, අනුස්මරණයකළේනම්; බිය, (ඒ) භය, බැහැරයේ, පිටත්යේ.

16 සුදනෝ තම සිරිත්-කලවුත් තමන් ලෙසම සලකත්,
පහනින් ගත් පහන්-එකලෙස බබලන විලස්නෙන්.

17 මුතුමිණිකනාවත්-නොමදැ ලැබපලඳිතත් සිරසේ,
ගුණනුවණ සිප්දත්-දරුවත් ලබනු වැඩිපෙම් වඩයි.

18 සවණ පිණවනසව්-නදට තුටුවන දනෝ ලෙව්හි,
තමදරුවන් බොලඳ-වදන් නොහැසූනැසූ එ දනෝ.

19 තමපාපිටෙහි උන්-රුපුන් නොනසා රකිති උතුමෝ,
අඳුරුරුපු පාන්කදු-මුල අඳුරු නුදුරුකලා මෙන්.

20 උතුමෝ උදනබස්-නොහසන් සතන් බස් මිස,
සුගඳදුගදඳකට-සතුටුනොසතුටුගහණවනමෙන්.

---

15 සුදනෝ, සත්පුරුෂයෝ; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; පිරිහුණත්, පරිහීණවූවත්; තමන්ගුණ, තමන්ගේ ගුණධර්මයන්; අඩුනොකෙරෙති, ඌනනොකෙරෙත්; රත්බඳුන, සුවර්ණභාජනය; බිඳුනත්, භග්නවූවත්; ඇති, ඇත්තාවූ; බර, භාරයභා, අගය, වටිනාකම; අඩුනොවනමෙනි, ඌනනොවන්නාමෙනි.

16 සුදනෝ, සත්පුරුෂයෝ; තමසිරිත්, තමන්ගේ චාරිත්‍රයන්; කලවුත්, කළාවූඅය; තමන්ලෙසම,තමන්වැනිකොටම;සලකත්, කල්පනාකෙරෙත්; පහනින්, ප්‍රදීපයෙන්; ගත්, ග්‍රහණයකළාවූ; පහන්, ප්‍රදීපයන්; එකලෙස, එකාකාරයෙන්; බබලනවිලස්නෙන්; භ්‍රාජිතවන්නාමෙනි.

17 මුතුමිණිකනාවත්, මුක්තාමාණික්‍ය කනකාදීවස්තූන්; නොමදැ, බොහෝකොට, ලැබ, ලැබා;සිරසේ, මස්තකයෙහි; පලඳිතත්, ප්‍රසාධනයකරතත්; සිප්දත්, ශිල්පශාස්ත්‍රදත්තාවූ; ගුණනුවණ,ගුණහා ඥානයඇත්තාවූ; දරුවන්, දරුකයන්; ලබනු, ලැබීම; වැඩිපෙම්, අධිකප්‍රේමය; වඩයි, වර්ධනයකෙරේ.

18 ලෙව්හි, ලොකයෙහි; සවණ, කර්ණය; පිණවන, පිනනයකරවන්නාවූ; සව්නදට, සියලුමනාදයන්ට; තුටුවන,සතුටුවන්නාවූ; දනෝ, ජනයෝ; තමදරුවන්, තමන්දරුකයන්ගේ; බොලඳවදන්, මොලකැටිතෙපුල්; නොහැසූ, ශ්‍රවණයනොකළෝද; එදනෝ, ඒ ජනයෝ;නැසූ,(කර්ණපීනනයකරණශබ්දයක්)ශ්‍රවණයනොකළෝ.

19 තමපාපිටෙහි, තමන් (පිටිපත්ල පාපුටුවහෝ) පාමුල; උන්, උන්නාවූ; රුපුන්, සතුරන්, නොනසා, විනාශනොකොට; උතුමෝ, උත්තමයෝ; රකිති,රක්‍ෂාකෙරෙත්; අඳුරුරුපු,අන්ධකාර ශත්‍රුවූ; පාන්කදු, ප්‍රදීපයෂ්ටිය; මුල,මුල්හි; අඳුරු, අන්ධකාරය; නුදුරුකලාමෙන්; දුරුනොකළාමෙනි.

21 ඇසුරුවන් සතසිය–සියපණසෙ රකිනාසුදනහට;
මොක්දකිනදුතුරු–දුකක්නොමවේ සව්සතන්ගෙන්.
22 ඇමසැපයටමවැඩි–සැපතෙක් දනුවදුකුම උතුමන්,
ඊටත්වැඩිසැපෙකි–නොදැකීම කලෙකත් දුදනයන්.
23 උතුමෝ නොලැබලැබ–වැඩකෙරෙති ලොවෙහි නිවතුන්ට ත්
නොයෙක් පලබරතුරු–සඳ පලදා සත රකිනළුව්.
24 මසුරුවූ දනා දන–සුදනනට පත් දනට වැඩවේ,
කරදිය මේරදුට–හසුව සතහට අමාවනමෙන්.
25 නිදුකින් සව්ඉසුරු–නොමදලැබෙතත් නුවණැතියෝ,
අනුන් නසා ලබන–ඉසුරු වසුරු ඈසුරු සලකත්.

---

20 උත්මෝ, උත්තමයෝ; සත්බස්මිස, සත්පුරුෂයන්ගේ වචන විනා; දුදනබස්, දුර්ජනයන්ගේවචන; නොහසත්, ශ්‍රවණය නොකරත්; සුගඳදුගඳදෙකට, සුගන්ධදුර්ගන්ධදෙකට; සතුටු නොසතුටු, සන්තොෂඅසන්තොෂදෙක්හි; ගඳණවනමෙන්, නාසය පවත්නාමෙනි.

21 ඇසුරුවන්, ආශ්‍රයට පැමිනියාවූ; සියසත, නොයෙක් සත්වයන්; සියපණසෙ, ස්වකීයප්‍රාණය පරිද්දෙන්; රකිනා, රක්‍ෂාකරන්නාවූ; සුදනහට, සත්පුරුෂයන්ට, මොක්දක්නදුතුරු, නිවන්දක්නාජාතිය(නොහොත්)දවසදක්වා; සව්සතන්ගෙන්, සියලුසත්වයන්ගෙන්; දුකක්නොමවේ, (කිසි) දුකක්නොමවන්නේය.

22 උතුමන්, උත්තමයන්ගේ; දුකුම, දර්‍ශනය; ඇමසැපයටමවැඩි, සියලුසැපයටමවඩා; සැපතෙකි, සම්පත්තියකැයි; දනුව, දැනගන්නේය; දුදනයන්, දුර්ජනයන්; කලෙකත්, (කිසි) කාලයකත්; නොදැකීම, අදර්‍ශනය; ඊටත්වැඩි සැපෙකි, ඊටත්වඩාසම්පත්තියෙකි.

23 උතුමෝ, උත්තමයෝ; ලැබ, ලාභයන්; නොලැබ, නොමලබා; ලොවෙහි, ලොකයෙහි; නිවතුන්ටත්, නීචයින්ටත්; වැඩකෙරෙති, අභිසිඩකරත්; නොයෙක් පලබරතුරු, අනෙකප්‍රකාරඵලභරිත වෘක්‍ෂයෝ; සඳ, හැමකල්හි, පලදා, ඵලයන්දීමෙන්; සත, සත්වයන්; රකිනළුව්, රක්‍ෂාකරත්නාමෙනි.

24 මසුරුවූදනා, මාත්සර්‍ය්‍යයී ජනයාගේ; දන, වස්තුව; සුදනනට, සුජනයාගේ ගෘහයට; පත්, පැමිනියේ; දනට, ජනයාට; වැඩවේ, අභිසාධකවේ; කරදිය, (සමුද්‍රයෙහි) ලවණජලය; මේරදුට, මෙඝරාජයාට; හසුව, අසුවී; සතහට, ලොකසත්වයාට; අමාවනමෙන්, මිහිරි වන්නාමෙනි.

25 නිදුකින්, නිර්දුඃඛයෙන්; සව්ඉසුරු, සකලෛශ්වර්‍ය්‍යය; නොමද, බොහෝකොට; ලැබෙතත්, ලැබෙන්නේනමුත්, නුවණැතියෝ,

26 ගුරුන් දෙගුරුන්හා–නෑසිය සුතඹු රකිනසුදනෝ,
මෙලොව යස මගුලුත්–ලබන්පරලොව සුව සගමොක්.

27 ගුණමකු දනන්හා–සමගවිසුවත් නැණැතිසුදනෝ,
මනාගුණ නොහරිත්–කොසඹතුරතුළ බැඳි මීයමෙන්.

28 කලගුණද රසබස–දෙකම දූනගත් නැණැති සුදනෝ,
මිනිස්වෙස්ගෙණවුත්–මෙලොව සතරකින සුරතුරුමෙනි.

29 නුවණැතියෝ සසල–නොවෙත් කෙතරම්දුක් සැපවුවත්,
ගැසුවත් තදවේග–පවනින් නිසල සලමෙන්.

30 විරිදුන් මදවරද–කියනුයේ දකිනට තමන්දෙස්,
කිසිකලෙකත් දුකක්–කෙසග විතරත්නොවේදෙලොවින්.

---

නුවණැත්තෝ; අනුත්, අන්‍යයන්; නසා, විනාශකොට; ලබන, ලබන්නාවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; වසුරුඅසුරු, වර්චස්මෙන්, සලකත්, සිතත්.

26 දෙගුරුන්හා, මව්පියදෙදෙනාහා; ගුරුන්, ආචාර්‍ය්‍යයන්ද; නෑසිය, ස්වකීය නෑයන්ද; සුතඹු, පුත්‍රදාරාවන්ද; රකින, (දැහැමින්) රක්‍ෂාකරන්නාවූ; සුදනෝ, සාධුජනයෝ; මෙලොව, මෙලෙව්හි; යස, කීර්තියත්; මගුලුත්, මඞ්ගල්‍යත්; පරලොව, පරලෙව්හි; සගමොක්සුව, ස්වර්ගමොක්‍ෂසැපත්; ලබත්, ලබත්නෝයි.

27 නැණැති, නුවණැත්තාවූ; සුදනෝ, හුදීජනයෝ; ගුණමකු, (අන්‍යයන්ගේ) ගුණ මකන්; දනන්හා, ජනයන්හා; සමග, එකතුව; විසුවත්, වාසයකළත්; මනාගුණ, (තමන්ගේ) යහපත්ගුණයන්; නොහරිත්, නොහරින්නෝයි; කොසඹතුරතුළ, නිම්බවෘක්‍ෂකොටරාභ්‍යන්තරයෙහි; බැඳි, බැන්දවූ; මීයමෙන්, මධුපටලයමෙනි.

28 කලගුණද, කළාවූගුණයන්ද; රසබස, මිහිරිවචනයන්දයන දෙකම, ද්විප්‍රකාරයම; දූනගත්, දැනගත්තාවූ; නැණැති, ප්‍රඥාවන්තවූ; සුදනෝ, සාධුජනයෝ; මිනිස්වෙස්ගෙණ, මනුෂ්‍යවෙශධාරීව; අවුත්, ආගමනයකොට; මෙලොව්, මේලොකයෙහි; සත, සත්වයන්; රකින, රක්‍ෂාකරන්නාවූ; සුරතුරුමෙනි, කල්පවෘක්‍ෂවෑන්නෝයි.

29 නුවණැතියෝ, ඥානවන්තයෝ; දුක්සැප, දුක්හාසැප; කෙතරම්වුවත්, කොපමණවුවත්; සසලනොවෙත්, චචලනොවෙති; තදවේගහැසුවත්; දැඩිවෙගවත් ප්‍රහාරලත්නමුත්; පවනින්, මාරුතයෙන්; නිසල, නොසෙල්වෙන; සලමෙන්, පර්වතයමෙනි.

30 විරිදුන්, විරොධීන් විසින්, මදවරද, මඳවද්‍යයත්; කියනුයේ, කියන්නේය; තමන්දෙස්, තමන්ගේ දෙෂයන්; දකිනට, දක්නාහට; දෙලොවින්, මෙලොව පරලොවදෙකින්; කිසිකලෙකත්, කොයිකාලයකවත්; දුකක්, දුඃඛයක්; කෙසගවිතරත්, කෙශාග්‍රයක් ප්‍රමාණවත්; නොවේ, නොවන්නේය.

31 උතුමන් ගුණනුවණ-කියනුහට දෙලෝ වැඩ අත් වේ,
එහෙයින් සත්සතන්-ගුණත් මනුවණ පමණදක්වමි.
32 රන්බඳුනෙහි කෙසර-තෙල්අඩු නොවී පවතිනමෙන්,
උතුමන් හද සපිරි-කුළුණුමෙත් අඩු නොවී පවතියි.
33 සුදනෝ නිවත්වත්-පරහට දුකක්විට පිහිට වෙත්.
කිසිනැති පවන්පත-පවන ඇර යා ගිම්නරිනමෙන්.
34 දෙපසරුපුනිඳිතත්-වෙසෙති සැපදෙසම නුවණැතියෝ
දසත්දෙතිසක්මැද-නොතැළි දිව දිව දවසරිනමෙන්.
35 යමෙකු කළ යහපත-සිහිවනුයෙ ලොව නපුර නැත,
ලුහුද නකළ නපුර-සිතනොතබනුයේ යහපතෙක් ඇති.

---

31 උතුමන්, උත්තමයන්ගේ, ගුණනුවණ, ගුණඥණයන්; කියනුහට, කථනයකරන්නාට; දෙලෝවැඩ, උභයලොකාභිවෘද්ධිය; අත්වේ, හස්තප්‍රාප්තවේ; (නොහොත්) දෙලෝ, උභයලොකයෙහි; වැඩ, වෘද්ධියහ; අත්, අර්ථසිද්ධිය; වේ, වන්නේය; එහෙයින්, ඒ හෙතුවිසින්; සත්සතන්, සාධුසත්වයන්ගේ; ගුණත්, ගුණයනුත්; මනුවණපමණ, මාගේ ඥනප්‍රමාණයෙන්, දක්වමි, ප්‍රකාශකෙරෙමි.

32 රන්බඳුනෙහි, සුවර්ණභාජනයෙහි; කෙසරතෙල්, සිංහතෛලය; අඩුනොවී, ඌනනොව; පවතිනමෙන්; පවත්නාසේ; උතුමන්, උත්තමයන්ගේ; හද, හෘදයෙහි; සපිරි, සම්පූර්ණවූ; කුළුණුමෙත්, කරුණාමෛත්‍රිය; අඩුනොවී, ඌනනොව; පවතියි, ප්‍රවර්තිතවේ.

33 සුදනෝ, සත්පුරුෂයෝ; නිවත්වත්, නිර්ධනිවූවත්; පරහට, අන්‍යයන්ට; දුකක්විට, දුඃඛයක්ඇතිකල්හි; පිහිටවෙත්, ප්‍රතිෂ්ඨාවන්නෝය; කිසිනැති, කොහෙත් (පවන්) නැත්තාවූ; පවන්පත, විජිනිපත්‍රය; සාපවන ඇර, යහපත් පවන්යවා; ගිම්නත්, ග්‍රීෂ්මය; අරිනමෙන්, පහකරන්නාමෙනි.

34 දෙපස, උභයපාශ්වයෙහි; රුපුන්, සතුරන්; ඉඳිතත්, ඉන්නේනමුත්; නුවණැතියෝ; ඥනවන්තයෝ; සැපදෙසම, සැපපෙදෙස්හිම, වෙසෙත්, වාසයකරත්; දෙතිසක් දසන්මැද, දෙතිස්දන්තමධ්‍යයෙහි; දිව, ජිහ්වාව; දිව, ධාවනයකරමින්; නොතැළි, නැළෙන්නේනැතිව; දවසරිනමෙන්, දවස්යවන්නාමෙනි.

35 යමෙකුකළ, යමක්හුවිසින් කරණලද්දවූ; යහපත, යහපත්කම; සිහිවනුයෙ, සිහිවන්නේනම්; ලොව, ලොකයෙහි; නපුර, නපුරක්; නැත, නැත්තේය; ලුහුදන, ලඝුජනයාවිසින්; කළ, කරණලද්දවූ; නපුර, නපුරුකම; සිත, චිත්තයෙහි; නොතබනුයේ, නොතබන්නේනම්; යහපතෙක්ඇති, යහපතක්ම ඇත්තේයි.

36 කෙත්වත් ලොව නොයෙක්-පලතුරුරකිනා මේගම්ලසින්,
සත්සත් කලත්සැප-සතදුක්ගිවට මහත් සෙවනකි.

37 මහලුපඬි තපසුන්-අඳද දුබලවූ දිළිඳු සත්සත්,
මෙඈමට පිහිටවනු-නිරිඳුන්විනා අන්කෙනෙක්නැත්.

38 නොමදගංහෝඇල-දිය නිති වැදීත් නොපිරි සිඳුමෙන්,
අපමණ දන ලදත්-ඉසුරුමත්දනගෙ සිත් නොපිරේ.

39 යමෙකුයම්තැනකට-පමුනුවනු ගුණ දැනැයි නියවත්,
සුරිඳු දිනිඳුහැර-තරිඳුමැද සසැඳියා විලසින්.

40 මේග ගම් පලතුරු-පරහටම වැඩ.පමුනුවනුමෙන්,
සුදනන්ලත්.ඉසුරු-සව්සතට වැඩවේය නිතියෙන්.

---

36 ලොව, ලොකයෙහි; කෙත්වත්, ක්ෂෙත්‍රවස්තුන්හා; නොයෙක් පලතුරු,අනෙකප්‍රකාර ඵලවෘක්ෂයන්! රකිනා, රක්ෂාකරන්නාවූ; මේගවිලසින්, මෙඝයන් පරිද්දෙන්;සත්සත්,සත්පුරුෂයෝ;අත්කල, හ ස්තප්‍රාප්තකලාවූ; සැප, සම්පත්තිය; සත, සත්වයන්ගේ; දුක්ගිවට, දුඃඛග්‍රීෂ්මයට; මහත් සෙවනකි, මහත් ඡායාවකි.

37 මහලු, වෘද්ධයෝද; පඬි, පණ්ඩිතයෝද; තපසුන්, තාපසයෝද අඳද, අන්ධයෝද; දුබලවූ, දුර්වලයෝද; දිළිඳු, දරිද්‍රයෝද; සත්සත්, සත්පුරුෂයෝද යන; මෙඈමට, මේ සියල්ලට; පිහිටවනු, පිහිටවිමපිණිස; නිරිඳුන්විනා, රජුන්හැර; අත්කෙනෙක්, අන්‍යයෙක්; නැත්, නැත්තේය.

38 නොමද, බොහෝවූ; ගංහෝඇල,ගංගා හෝ මාතිකාවල, දිය, ජලය; නිති, නිරන්තරයෙන්, වැදත්, ප්‍රවිෂ්ටවීත්; නොපිරි, නොපිරෙන්නාවූ; සිඳුමෙන්, සමුද්‍රයසේ; අපමණ, අප්‍රමාණවූ; දන, වස්තුව; ලදත්, ලැබුවත්; ඉසුරුමත්, ඓශ්වර්‍ය්‍යවත්වූ; දනගෙ, ජනයාගේ; සිත්, චිත්තය; නොපිරේ, සම්පූර්ණනොවේ.

39 නියවත්, ප්‍රඥාවන්තයෝ; යමෙකු, යම්කෙනෙක්; යම්තැනකට, යම්ස්ථානයකට; පමුනුවනු, පමුනුවන්නේ; ගුණදැනයි, ගුණවිජානනයකොටමය; සුරිඳු, ශක්‍රයාවිසින්; දිනිඳුහැර, සූර්‍ය්‍යාපහකොට,තරිඳුමැද, චන්ද්‍රයාමධ්‍යයෙහි; සසැඳියාවිලසින්, සසලපය ඇන්දමෙනි.

40 මේග, මෙඝයතෙමේ; ගම්පලතුරු, ග්‍රාම්‍යඵලවෘක්ෂයන්ගෙන්; වැඩ,අර්ථයන්; පරහටම, අන්‍යයන්ටම; පමුනුවනුමෙන්, සම්ප්‍රාප්තකරවන්නාසේ; සුදනන්, සත්පුරුෂයන් විසින්; ලත්ඉසුරු, ලබනලද ඓශ්වර්‍ය්‍යය; නිතියෙන්, නිරන්තරයෙන්; සව්සතට, සියලුසත්වයන්ට; වැඩවේ, වැඩපිණිස වන්නේය.

41 නීතයන් රගෙණත්–සිදුවනු දෙයක් කෙරෙ නැණැතියේ,
කතා නොමඳතිවන්–ලෝ කැඩපතෙන් එත බලනුමෙන්.

42 එකකට වනි එකෙක්–සමනි අනිකෙක් අනික්එකකට,
තද පවන ලදුවත්–නැව ගොඩ රතය මුහුද නොදිවේ.

43 ඇම සතට වැඩවන–ගම්මැදෙහි පලතුරක් විලසින්,
සුදනන් අතට පත්–ඉසුරු වැඩවේ සව් ලෙව් හටත්.

44 නසතත් දුදනයන්–සුදනෝ උන්ටම වැඩ සලකත්,
සඳුන්තුර සිඳිනා–පොරව මුවඅත සුවඳ වනමෙන්.

45 තද රුදු ගුණැති වත්–ලියෝ මිදහස සිසිල පැලත්,
තද යකඩින් තැනුද–යාපත් සිසිලසය පානෙව්.

46 රකුසෙක් තම ලියක්–තිබී කරඬුවක ලා කුසතුළ,
එගිතුළ වත් සිදුට–තම හිමිට දියුණුව කළා පෙමි.

---

41 නිතයන්, ගීතයන්; රගෙණත්, ග්‍රහණයකොටත්; සිදුවනුදෙයක්, සිඩවනඅර්ථයක්; නැණැතියේ, ඥානවන්තයා; සිදුකෙරේ, සිඩකෙරේ; කතා, රත්රන්; නොමද ඇතිවත්, බොහෝ ඇත්නමුත්; ලෝකැඩපතෙන්, ලොහාදශයෙන්; එත, මුහුන; බලනුමෙන්, බලන්නාමෙනි.

42 එකකට, එක්වැඩකට; එකෙක්, එක්කෙනෙක්; වනි, පොහොසත්; අනිකෙක්, අන්‍යයෙක්; අනික්එකකට, අනික්වැඩකට; සමනි, සමර්ථයි; තදපවන, චණ්ඩමාරුතය; ලදුවත්, ලැබුවේනමුත්; නැව, නෞකාව; ගොඩ, ථලයෙහිද; රතය, රථයතෙමේ; මුහුද, සමුද්‍රයෙහිද; නොදිවේ, නුදුවයි.

43 ඇමසතට, සියලුසත්වයන්ට; වැඩවන්, අර්ථසිඩවන්නාවූ; ගම්මැදෙනි, ග්‍රාමමධ්‍යයෙහි; පලතුරක්විලසින්, ඵලවෘක්ෂයක්මෙන්; සුදනන්, සත්පුරුෂයන්ගේ; අතට පත්, හස්තප්‍රාප්තවූ; ඉසුරු, ඓශ්වර්යය; සව්ලෙව්හටත්, සියලු ලොකයාහටත්; වැඩවේ, වැඩපිණිස වන්නේය.

44 සුදනෝ, සත්පුරුෂයෝ; දුදනයන්, දුර්ජනයන් විසින්; නසතත්, නසනුලබන නමුත්; උන්ටම, ඔවුන්ටම; වැඩ, වෘඩිය; සලකත්, සලකති; සඳුන්තුර, චන්දනවෘක්ෂය; සිඳිනා, ඡේදනයකරන්නාවූ; පොරොව, පරශුවගේ; මුවඅත, ධාරාව; සුවඳවනමෙන්, සුගන්ධවන්නාමෙනි.

45 තද, දැඩිවූ; රුදු, රෞද්‍රවූ; ගුණැතිවත්, ගුණඇතිවූත්; ලියෝ, ස්ත්‍රීයෝ; මදහසසිසිල, මන්දහාස්‍යශීතලය; පැලත්, පෙන්වත්; තද, දැඩිවූ; යකඩින්, අයෙන්; තැනුද, සැදුවා වූත්; යාපත්, යකඩපත්‍ර; සිසිලසය, ශීතලය; පානෙව්, දක්වන්නාමෙනි.

47 සඳනදකරණ සඳ-පහන් සියුරන් මන තෙමන මෙන්,
සඳ සඳ පහන් සඳ-සලෙලු සඳකොඳ සඳපහන්වේ.

48 නිමලගුණ රුසිරි-ඉසුරු තෙද විකුම් ඇති තැනටත්,
පැමිණ තද රැකවල්-ඇතත් සිතුවක් කෙරෙති අඟනෝ.

49 කනාලිය පැරයු-තුනුසිරි මවා ඇතිදු සිව්වත්,
මනගුණ පියා පිය-ඉදුතුළ ගල තුලේ තුලේ.

50 වැදූවත් දරුවන්-ලදුන් සෙනෙහස සැබෑ නොකරව්,
සිළුමිණිනි බබලන-උරගවිස සහවා කෙළිනවැන්නේ.

51 ගෙසි දේශ පිටතදී-තැනතැනා ඇවිද කරණ තොපණන්,
ලියන්ගෙන් වනවැඩ-ඇතත්උන්කෙරෙහිලොබනොකරව්.

---

46 රකුසෙක්, රාක්ෂසයෙක්; තමලියක්, තමන්ගේස්ත්‍රියක්; කර ඬුවක ලා, කරඬුයෙකබහා; කුසතුළ, කුක්ෂ්‍යභ්‍යන්තරයෙහි; තිබී, තැබුයේය;එහිතුළ,ඒ කරණ්ඩකාභ්‍යන්තරයට; වත්, ප්‍රවිෂ්ටවූ;සිදුට, සිද්ධයාට; තමහිමිට, තමන් ස්වාමියාට වඩා; දියුණුව, දෙගුණයක්ව; පෙම්කළා, ප්‍රේමකළාය.

47 සඳ, සන්ධ්‍යාකාලයෙහි; සඳනදකරණ, චිත්තානන්දකරවූ; සඳප හන්,චන්ද්‍රාලොකය; සියුරන්, චකොරයන්ගේ; මන, චිත්තය; තෙම නමෙන්, සතුටුකරන්නාසේ; සඳ, සුන්දරීයගේ; පහන්සඳ, ප්‍රසන්න චිත්තය; සලෙලු, සල්ලාලයාගේ; සඳකොඳ, සිත්නැමතිකුන්දයට; සඳපහන්වේ, චන්ද්‍රප්‍රභාවෙයි.

48 නිමල, නිර්මලවූ; ගුණ, ගුණයන්ද; රුසිරි, රූපශ්‍රියද; ඉසුරු, ඓශ්වර්‍ය්‍යයද; තෙද, තෙජස්ද; විකුම්, වික්‍රමද; ඇති, ඇත්තාවූ; තැ නටත්, ස්ථානයටත්; පැමිණ, සම්ප්‍රාප්තව; තදරැකවල් ඇතත්, දැඩිවූ ආරක්ෂා ඇත් නමුත්; අඟනෝ, ස්ත්‍රියෝතුමූ; සිතුවක්කෙරෙති, අභි මතදෙයක් කෙරෙති.

49 කනාලිය, කනකලතාවන්;පැරයු, පැරදවූ;තුනුසිරි,ශරීරශ්‍රිය; සිව්වත්, මහාබ්‍රහ්මයා විසින්; මවා, නිර්මිතකොට; ඇතිදු, ඇත්තේන මුත්; පිය, ස්ත්‍රියගේ; මනගුණ, චිත්තයෙහි (යහපත්) ගුණයන්; පියා, පසකොට; ඉදුතුළ, හෘදයාභ්‍යන්තරය; තුලේ, මහත්වූ; ගල, ගලක්; අතුලේ, අතුරණලදී.

50 දරුවන්, දරකයන්; වැදුවත්, ප්‍රසූතකළත්; ලදුන්, ස්ත්‍රීන්ගේ; සෙනෙහස, සෙනහය; සැබෑනොකරව්, සත්‍යනොකරව්; සිළුමිණිනි, ශිරොමාණික්‍යයෙන්; බබලන, බබලන්නාවූ; උරග, නාගතෙමේ; වි සසහවා, විෂයගුප්තකොට; කෙළිනවැන්නේ, ක්‍රීඩාකරන්නාමෙනි.

52 තම සිතට නොහැ ගෙන-ලෙස වසන් රුදු දූත අඟනන්,
ලූණුබෝ මාලුවෙනි-ලොබ නොවූමෙන් හැර කරව් දුරු.

53 සලෙලුන් දූකලියන්-සැඟවෙනු නොවේ විළියෙන්,
බලලූන් ගොදුරනට-පැමිනෙන තෙක්වැන්න සැඟවුම්.

54 අඟනන්ට රැකවල්-කර පමණකට ඉඳින අවියත්,
බිජුවපුරා වැවේ-සියොතුන්ට බැඳ ඉඳින වැටවෙනි.

55 තමාගති නොමදන-තැන්තැන්හි පරහන පතනුවෝ,
අමායයි රාපී-දෙලොව දුක්විඳිනවුන් වැන්නෝ.

56 සගමොක් දෙකටයන-මග අකුලි මාපත නිරායන්,
විසමුසු අමායුත්-ලියෝ මායම්පිරූ බඳනෙක්.

---

51 ගෙයිදෙය, ගෘහයෙහි ද්‍රව්‍යයන්; පිටතදී,පිටතදීලා;තැනතැන, තන්හිතන්හි;ඇවිද,ආහිණ්ඩනයකොට; නොපණත්කරණ,අයුතුකම් කරන්නාවූ; ලියන්ගෙන්, ස්ත්‍රීන්ගෙන්; වනවැඩඇතත්, වන්නාවූ අර්ථඇත්නමුත්; උන්කෙරෙහි, ඒ ස්ත්‍රීන්කෙරෙහි; ලොබනොකර ව්, ලොභනොකරව්.

52 තමසිතට, තමාගේ චිත්තයට; නොහැගෙනලෙස, එකඟනො වනපරිද්දෙන් (නොසොත්) නොදැනෙන පරිද්දෙන්; වසන, වාසය කරන්නාවූ; රුදු, රෞද්‍රවූ; දූතඅඟනන්, ධූර්තස්ත්‍රීන්; ලූණුබෝමාලු වෙනි, ලවණඅධිකව්‍යජනයෙහි; ලොබනොවූමෙන්, ලොභනොවූවා සේ; හැර, පහකොට; දුරුකරව්, දූරීභූතකරව්.

53 ලියන්, ස්ත්‍රීන්; සලෙලුන්දූක, තරුණයන් දූකලා; සැඟවෙනු, සැඟවීම;විළියෙන්නොවේ, ලජ්ජාවෙන් නොවන්නේය; ගොදුර,ගො චරය; අතට පැමිනෙනතෙක්, හස්තප්‍රාප්තවනතුරු; බලලූන්, බිලා ලයන්ගේ; සැඟවුම්වැන්න, සැඟවීම්හා සමානයි.

54 අඟනන්ට, ස්ත්‍රීන්ට; පමණකට, ප්‍රමාණයකට; රැකවල්කර, ර ක්ෂාවරණකොට; ඉඳින, ඉන්නාවූ; අවියත්; අව්‍යක්තයන්; වැවේ, වාපියෙහි; බිජු, බීජයන්; වපුරා, වාපනයකොට; සියොතුන්ට, පක්ෂි න්ට; වැටබැඳ, වෘතිබන්ධනයකොට; ඉඳිනවැනි, ඉන්නාමෙනි.

55 තමාගති, තමන්ගේ ස්වභාව; නොමදන, නොහැඳිනම; තැන් තැන්හි, තැනින්තැන; පරහන, පරස්ත්‍රීන්, පතනුවෝ, ප්‍රාර්ථනාකර න්නෝ; අමායයි, අමෘතයයි (වරදවා) සිතා; රාපී, සුරාපානයකො ට; දෙලොව, උභයලොකයෙහි; දුක්, දුඃඛය; විඳිනවුන්වැන්නෝ, විඳින්නාවුන්වැනියි

56 ලියෝ, ස්ත්‍රීහු; සගමොක්දෙකට, ස්වර්ගමොක්ෂදෙකට; යන, ග මනයකරන්නාවූ; මග, මාර්ගයට; අකුලි, අකුලෙක; නිරායන, නිරය

57 ළඳුන් පෙම්බැඳුමට-පැමින දුක්විඳිනු අවියත්,
බෝසත්රණ මොණර-සෙබඩක නිසා වුත් බැඳුනුවැනී.

58 ඉම්හිමි ඉන්දදී-නොහිමි දුව කල්බඳින සොරගන,
තම බුදිනා මස්ඇර-නොකන මස්කා කුල නසනමෙනී.

59 ලියන් නිසාකරණ-බැහැර නොමද දුක්විඳිත සත,
පබවත කෙරෙ ලොබින්-කුසරජ පවා වසුන්කත් ඇද්දේ.

60 ලියෝ බොරු සෙනෙහස-පැපෑ තම් හිමි සොරු ගෙණනසත්,
කොටෙකුට කළ ලොබින්-ගලින් බෝසත් එළු ලියමෙන්.

61 ගුණනැණ විරියලිය-ඉඳිනා ගෙට වැඩවේය සව්සිරි,
සව්සිරි සපිරි ගේවත්-අවගුණ ලියක් වන දිළිඳුවේ.

---

වයන්නාවූ; මාපත, මහාපථයෙක; විසමුසු, විෂමිශ්‍රවූ; අමාසුන්, අමෘතයක්වැන්න; මායම්පිරූ,රැවටිලිපිරුණාවූ;බඳනෙකි,භජනයෙකි.

57 අවියත්, අව්‍යක්තයන්; ළඳුන්, ස්ත්‍රීන්ගේ; පෙම්බැඳුමට, ප්‍රේමබන්ධනයට; පැමින, අසුව; දුක්විඳිනු, දුක්විඳිම; රණමොණර බෝසත්, ස්වර්ණමයූරවූ බොධිසත්වතෙම; සෙබඩකනිසා, මොණරියක් සඳහා; අවුත්, ආගමනයකොට; බැඳුනුවැනී, (මලපතෙහි) බන්ධනයවූනාමෙනි.

58 ඉම්, හිමිවූ; හිමි, ස්වාමියා; ඉන්දදී, විද්‍යමානකල; නොහිමිදුව, අනිම්යන්දුවුව; කල්බඳින, කාලයබන්ධනයකරන්නාවූ; සොරගන, චෞරස්ත්‍රීහු; තමබුදින, තමන් අනුභවකරන්නාවූ; මස්ඇර, මාංසයන් බැහැරලා;නොකනමස්, අනුභවනොකරණමාංසයන්; කා, අනුභවකොට; කුලනසනමෙනි, කුටුම්බය විනාශකරන්නා හා සමයි.

59 ලියන් නිසා කරණ, ස්ත්‍රීන්ආශ්‍රය කරන්නාවූ; සත, සත්වයෝ; බැහැර, බාහිරවූ; නොමඳදුක්, අනල්පවූදුඃඛයන්; විඳිත, විඳිති; පබවතකෙරෙ, ප්‍රභාවතියකෙරෙහි; ලොබින්, ලොභයෙන්;කුසරජපවා, කුසරජහුද; වසුන්කත්ඇද්දේ, අඩුක්කු කත් ගෙණගියේයි.

60 ලියෝ, ස්ත්‍රීහු; බොරුසෙනෙහස, අසත්‍යසෙනහය; පැපෑ, ප්‍රකාශකරකර; සොරුගෙණ, චෞරපුරුෂයන් ග්‍රහණයකොට; තමහිමි, තමන්ස්වාමින්; නසත්, විනාශකරත්; කොටෙකුට, අත්පාකැපූ පුරුෂයෙකුට; කළලොබින්, කළාවූලොභයෙන්; බෝසත්, බොධිසත්වයන්;ගලින්,පර්වතයෙන්;එළු,පතිතකළාවූ;ලියමෙන්,ගැහැණිමෙනි.

61 ගුණනැණවිරිය, ගුණඥානවීර්‍ය්‍යඇත්තාවූ; ලිය, ස්ත්‍රිය; ඉඳින, වාසයකරන්නාවූ; ගෙට, ගෘහයට; සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යය; වැඩවේය, වෘඩිවේ; සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යයෙන්; සපිරි, සම්පූර්ණවූ; ගේවත්, ගෘහයවත්; අවගුණලියක්, අගුණස්ත්‍රියක්; වන, ප්‍රවිෂ්ටවීනම්; දිළිඳුවේ, දරිද්‍රවේ.

62 සියලිය පමණකොට-ඉඳින අවියත් දනෝ ලෙව්හි,
විසඝොර උරගගෙණ-උරේලාකෙළනවුන් වැන්නෝ.

63 උරණහැමකල නොව-සෙහෙන් රකිතත් පණසෙ නිතියෙන්,
බඩුවක් මෙන් විකිණ්-පහස දෙත් කාටවත් අඟනෝ.

64 බොරු මායම් කියා-සැබෑ වරදත් නැතැයි සාදත්,
සොරු කා යම් දෙයක්-දුනත් ගෙණ සහතොසින් ලංවෙත්.

65 එකෙකු සෙව් දෙයගෙණ-එකෙකු කවමින් සෙව්තිබැඳපෙම්,
කෙසරිඳු එළු ගිජිඳු-සිවල් කාකා කකා යනමෙන්.

66 ඇස දුටු වරදවත්-බොරුයයි කියති බැහැර වැස වැස,
තදබොරු විස තබා-මිහිකත්තොමෝ ගිළු ලිය පෙර.

---

62 සියලිය, ස්වකීයස්ත්‍රිය; පමණකොට, ප්‍රමාණකර(හෙවත්)සියලු කටයුත්තෙහි සුදුසුයයි විශ්වාසකොට; ඉඳින, වාසයකරන්නාවූ; ලෙව්හි, මේ ලොකයෙහි; අවියත්දනෝ, අව්‍යක්තජනයෝ; විස, විෂයෙන්; ඝොර, ඝොරවූ; උරගගෙණ, නාගයන්ගෙණ; උරේලා, වක්ෂස්ථලයෙහිබහා; කෙළනවුන්වැන්නෝ, ක්‍රීඩාකරන්නාවුන්වැනිසහ.

63 හැමකල, සියලුකාලයෙහි; උරණනොව, කොපනොවී; නිතියෙන්, අනවරතයෙන්; පණසෙ, ප්‍රාණයපරිද්දෙන්; සෙහෙන්, මනාකොට; රකිතත්, (ස්වාමියා විසින්) ආරක්ෂාකරතත්; අඟනෝ, ස්ත්‍රීහු; විකිණිබඩුවක්මෙන්, විකුණනලද භාණ්ඩයක්සේ; කාටවත්, කොයිකෙනෙකුටවුවත්; පහස, ස්පර්ශය; දෙත්, දනයක්රත්.

64 (අඟනෝ, ස්ත්‍රීහු;) බොරුමායම්, බොරුරැවටිලි; කියා, කථනයකොට; සැබෑවරදත්, සත්‍යවූ වද්‍යයත්; නැතැයි, නැත්තේයයි; සාදත්, සිඩකරත්; සොරුකා, චෞරපුරුෂයා අනුභවකොට; යම්දෙයක්, යම්ද්‍රව්‍යයක්; දුනත්, දනයකළනමුත්; ගෙණ, (ඒ ද්‍රව්‍යය) ග්‍රහණයකොට; සහතොසින්, සන්තොෂයෙන්; ලංවෙත්, (ස්වාමියාවෙත) ලඟාවන්නාහුය.

65 එකෙකු, එක්පුරුෂයෙක්විසින්; සෙව්දෙය, උපයනලදද්‍රව්‍යය; ගෙණ, ග්‍රහණයකොට; එකෙකු, අන්පුරුෂයෙකුට; පෙම්බැඳ, ප්‍රෙමබන්ධනයකොට; කවමින්, අනුභවක්රවමින්; සෙව්ති, (ස්ත්‍රියෝතුමූ) සෙවනයකරති; කෙසරිඳු, සිංහරාජයා; එළු, පතිත කළාවූ; ගිජිඳු, හස්තිරාජයන්; සිවල්කාකා, කැනහිලුන් හා කවුඩන්; කකායනමෙන්, අනුභව කර කර යන්නාමෙනි.

66 (ස්ත්‍රීහු) ඇසදුටුවරදවත්, ප්‍රත්‍යක්ෂවූ වරද නමුත්; බැහැරවැස වැස, පිටතවාසයකොටකොට; බොරුයයිකියති, මුසායයි පවසත්; තදබොරුවිසතබා, දැඩිබොරුනැමති විසතබමින්; ලිය, ස්ත්‍රියෙක්; පෙර, පූර්වයෙහි; මිහිකත්තොමෝ, මිහිකාන්තාව; ගිළු, ගිළුවා

67 දරුපෙම් ගුණනුවණ–සමත් බැව් මෙම කියති මලකල,
තමලිය ගුණඇතත්–නොකිය වියතුනි මළුත් උන්නත්.

68 සිරිමත්කළත් ලිය–ලුහුඳනටම ලොබ වඩත්මැයි,
කිරෙන් බත් ලූවත්–සුනකයෝ කසලටම ලොබ වෙත්.

69 ඉසුරට ලොබින් ලිය–ලොවට වැඩකරණුවන් වනසත්,
පඬිකාලිඳුසත්–නසා රජුනුත් වැනසී අඟනෙක්.

70 ලිය ලියලා තුරින්–තුරුද ඇද බඳ නිතිනි තුඩුදේ,
එමෙන් ලිය දුටුදුටු–සලෙලුන් බඳ වෙනත් තුඩුදේ.

71 සුරා සොරාම බි–උන්නත් රාමත එලි ලනමෙන්,
සොරා ලියන් කරණ–නොපණත් පෙනේ සඳලප මෙන්.

72 අඟනන් වසඟයට–නොපැමිනෙනුවෝ ඇද්ද ලෙව්හි,
සුරනා ඉසුරු තම–රකී ලිය ඉසින් උසුලනුයේ.

---

67 දරුපෙම්, දරුවන්කෙරෙහි ප්‍රෙමියද; ගුණනුවණ, ගුණභාඥනයද; සමත්බැව්, සමර්ථභාවයදැයි යන; මෙම, මේවා; මලකල, (සත්‍රීන්) මලකල්හි; කියති, කථනයකරත්; වියතුනි, ව්‍යක්තයෙනි; තමලිය, තමන්සත්‍රියගේ; ගුණඇතත්, ගුණඇත්තමුත්; මළත්උන්නත්, මළාහෝ උන්නාහෝ; නොකිය, කථනයනොකරව්.

68 සිරිමත්කළත්, ඓශ්වර්‍ය්‍යයෙන් පොහොසත්කළනමුත්; ලිය, සත්‍රියෝතුමූ; ලුහුඳනටම, සුලුජනයාටම; ලොබවඩත්මැයි, ලොභවර්ධනයකරත්මය; කිරෙන්, ක්ෂීරයෙන්; බත්ලූවත්, ආහාරදුන්මුත්; සුනකයෝ, බල්ලෝ; කසලටම, අසුචියටම; ලොබවෙත්, ලොභවන්නාහුය.

69 ලිය, සත්‍රීහු; ඉසුරට, ඓශ්වර්‍ය්‍යයට; ලොබින්, ලොභයෙන්;ලොවට්වැඩකරණුවන්, ලොකයට අර්ථසිද්ධකරන්නන්; වනසත්, විනාශකරත්; අඟනෙක්, සත්‍රියෙක්; පඬිකාලිඳුසත්, කාලිදාශපණ්ඩිතයාත්; නසා, විනාශකොට; රජුනුත්වැනසී, (කුමාරදශ) රජුන් විනාශකළා.

70 තුරින්, වෘක්ෂයෙන්; ලියලියලා, ලතාලියලා; තුරුදඇද, (අන්‍ය) වෘක්ෂයන්ද ආකර්ෂණයකොට; බඳ, වැලඳගෙණ; නිතිනි, නිතර; තුඩුදේ, තුණ්ඩදනයකරයි: එමෙන්, එපරිද්දෙන්ම; ලිය, සත්‍රී; දුටුදුටු, දුටු දුටුවාවූ; සලෙලුන්, තරුණයන්; බඳ, වැලඳගෙණ; වෙනත්, අන්‍යදිශාවලත්; තුඩුදේ, තුඩදනයකරයි.

71 සොරාම, හොරෙන්ම; සුරාබි, සුරාපානයකොට; උන්නත්, උන්නමුත්; රාමත, රාසෙහිමත්කම; එලිලනමෙන්, (බිබව) එලියේලන්නාසේ; ලියන්, සත්‍රින්ච්සිත්; සොරාකරණ, සොරෙන්කරන්නාවූ; නොපණත්, නින්දිතක්‍රියා; සඳලපමෙන්, ශශලාඤ්ජනයසේ; පෙනේ, දෘශ්‍යමානවේ.

73 ගෙයතුළෙහි ගිනිසිලු-ඇතත් තමකඳ නසනු දීපයෙන්,
මැතිසෙන් නොමඳුනත්-දීප බබලනු තෙදිනි නිරිඳුන්..
74 ඉසුරු අපමණ ඇති-රජුගෙ රටටත් සසල පැමිණේ,
ඉසුරු උන් කෙලෙසද-පවා ඉසුරු සසල නොකොළොද.
75 පුන්සඳට දෙවනා-තරුත් අමරුස පතුරුවන්නේ,
නිරිඳුන් පවතිනා-පණතමයි පවතිනේ මැතිවරු.
76 උබයපස සුපහන්-නැතද නොහොබී සුරවරන්ටත්,
නිරිඳුන්ට නොහොබී-වියත් මැතිවර දෙපස නැතහොත්.
77 දුකසුදුනොවී කිසි-දෙලොව සැපමොක් පතනවියතුනි,
දෙකසුදු නොමසිතා-පස්පවින් වැළකී කරව් පින්.

---

72 අඟනන්, අඞ්ගනාවන්ගේ; වසඟයට, වසඟවීමට; නොපැමිනෙනුවෝ, නොපැමිනෙත්තෝ; ලෙව්හි, ලොකයෙහි, ඇද්ද, ඇත්තෝද?; සුරනා, දෙවියන්ට නායකවූ; ඉසුරු, ඊශ්වරතම; තමලිය, තමන් භාය්‍ය්‍යාව; ඉසින්, ශිෂ්‍යයෙන්; උසුල්නුයේ, උච්ඡනයකරන්නේ; රකි, රක්‍ෂාකෙරේ.

73 ගෙයතුළෙහි, ගෘහාභ්‍යන්තරයෙහි; ගිනිසිලු, වහනිශිඛා; ඇතත්, ඇත්නමුත්; තමකඳ, අන්ධකාරය; යනු, පහවන්නේ; දීපයෙන්, පහනෙනි; මැතිසෙන්, අමාත්‍යසෙනාව; නොමඳුනත්, බොහෝ ඇත්නමුත්; දීප, දිවයින්; බබලනු, බබලන්නේ; නිරිඳුන්, නරේන්ද්‍රයන්ගේ; තෙදිනි, තෙජසිනි.

74 ඉසුරු, ඓශ්වය්‍ය්‍ය; අපමණඇති, අප්‍රමාණවඇත්තාවූ; රජුගෙ, රජ්ජුරුවන්ගේ; රටටත්, රාෂ්ට්‍රයටත්; සසල, චචලය; පැමිණේ, ප්‍රාප්තවේ; ඉසුරු, ඊශ්වරයා; උන්, වාසයකළ; කෙලෙසදපවා, කෛලාශයෙහින්; ඉසුරු, ඓශ්වය්‍ය්‍ය; සසල නො කොළොද, චචල නො කොළෝද?

. 75 පුන්සඳට, පූර්ණචන්ද්‍රයාට; දෙවනා, දෙවැනිවූ; තරුත්, තාරකාවෝත්; පතුරුවන්නේ, විහිදුවන්නේ; අමරුස, අමාරශ්මිහි; මැතිවරු, මන්ත්‍රිවරයෝ; පවතිනේ, ප්‍රවර්ත්තිතවන්නේ; නිරිදුන් පවතිනා, නරේන්ද්‍රයන්ප්‍රවර්ත්තිතවන්නාවූ; පණතමයි, පණනෙහිමයි.

76 උබයපස, උභයපාර්ශ්වයෙහි; සුපහන්, මනාප්‍රදීපයන්( නොහොත්)මනා ප්‍රසන්නය; නැතද, නැත්තේද; සුරවරන්ටත්, දෙවිවරුන්ට වුවත්; නොහොබී, හොබනේ නොවේ; වියත්, ව්‍යක්තවූ; මැතිවර, මන්ත්‍රීවරයෝ; දෙපස, උභයපාශ්වීයෙහි, නැතහොත්, නැත්තේවිනම්; නිරිඳුන්ට, නරේන්ද්‍රයන්ට; නොහොබී, හොබනේ නොවේ.

77 කිසිදුකසුදු, කිසියම්දුඃඛයයුත්; නොවී, නැතිව; දෙලොව, මෙලෝපරලෝදෙක්හි; සැප, සම්පත්තියහා; මොක්පතන, මොක්‍ෂයප්‍රාර්ථ

78 සව්සතට සහපත්-ලෙසට දවසරිණ නුවණැතියෝ,
මිය පරලොව ගියත්-ලබත් සුරනර සැපත් නිවණුත්.

79 බියෙන් තම වෙත පත්-සතන් නොබවා යෙහෙන් රැකියෝ,
බියක් නොව කලෙකත්-විඳිති සුරසිරි මොක් දකිත තෙක්.

80 නිරාදුකට වඩිත-දුකෙක් නැත දිවඇසින් බැලුවත්,
ඊටත් අනතුරුවේ-දෙගුරුන් නොරැක බඩ වඩනවා.

81 සුතනඹු රන්රුවන්-නොමද කෙත්වත් හා දූසිදසුන්;
මෙසියලු තිබියදී-කළ පව් පිණිසි කැටිව යන්නේ.

82 දියෙහිදු මස් පියුම්-කොඳ උපුල්හි ගඳ වෙනවෙන මෙන්,
එකකුසෙහි උපනත්-සතන් ගුණ වෙන වෙනම පවතිසි.

---

නාකරන්නාවූ; වියතුනි, ව්‍යක්තයෙනි; දෙකකුදු, දෙකක්; නොමසිතා, නොසිතා; පස්පවින්, (ප්‍රාණඝාතාදී) පව්පසින්; වැළකි, වෙන්වී; පින්කරව්, පුණ්‍යයන් කරව්.

78 සව්සතට, සියලුසත්වයන්ට; සහපත්ලෙසට, යහපත්ආකාරයට; දවසරිණ, දවස්යවන්නාවූ; නුවණැතියෝ, ඥනවන්තයෝ; මිය, මැරී; පරලොවගියත්, පරලොකප්‍රාප්තවූවත්; සුරනරසැපත්, දිව්‍යමනුෂ්‍ය සම්පත්හා; නිවණුත්, නිර්වාණයත්; ලබත්, ලබන්නෝය.

79 බියෙන්, භීතියෙන්; තමවෙත, තමන්සමීපයට; පත්, පැමිනියාවූ; සතන්, සත්වයන්; නොබවා, භයනොකරවා; යෙහෙන්, මනාලෙසින්; රැකියෝ, රක්ෂාකලෝ; කලෙකත්, (කිසි) කාලයකත්; බියක් නොව, භීතියක්නොවී; මොක්දකිනතෙක්, මොක්ෂය දක්නාකල්; සුරසිරි, දිවඉසුරු; විඳිති, විඳින්නෝය.

80 දිවඇසින්, දිව්‍යචක්ෂුසින්; බැලුවත්,නිරීක්ෂණයකළත්; නිරාදුකටවඩින, අපායදුඃඛයටවැඩිවූ;දුකෙක්, දුඃඛයෙක්;නැත, නැත්තේය; දෙගුරුන්, දෙමව්පියන්; නොරැක, රක්ෂානොකොට; බඩවඩනවා, බඩවැඩීම; ඊටත්අනතුරුවේ, (ඒ අපායදුකටත්වඩා) අන්තරාශ කරවේ.

81 සුතනඹු, පුත්‍රදාරාවන්ද; රන්රුවන්හා, සවර්ණ හා රත්නයන්ද; නොමද, බොහෝවූ; කෙත්වත්, ක්ෂෙත්‍රවස්තූන්ද, දූසිදසුන්, දාශිදාශයන්ද යන; මෙසියලු, මේසියල්ල; තිබියදී,(මෙලොව) තිබැද්දී; කැටිවයන්නේ, (මියපරලොව යන්නාහුසමග) එක්ව ගමනයකරන්නේ; කළ, තමන්විසින්කරණලද්දවූ; පව්පිණිසි,පාපහාපුණ්‍යයෝයි.

82 දියෙහිදු, ජලයෙහිහටගත්; මස්, මත්ස්‍යයන්ගේද; පියුම්, පද්මයන්ගේද;කොඳඋපුල්හි,කුමුද හා උත්පලයන්ගේද;ගඳ,ගන්ධය;වෙනවෙනමෙන්,වෙනස් වෙනස් පරිද්දෙන්; එකකුසෙහි,එක කුක්ෂියෙහි;

83 සියපණ සුත තඹුන්-සව්සිරි විකුම් පවති නොසිතව්,
නුවණැසිනි විමසා-බැලුව සීනෙන් ලත් ඉසුරුවැනි.

84 දුකක් සැලසුනු සත-තෙදැතියන් නමකියා ගැලවෙත්,
සපුත් සත ඬැහැකල-ගුරුළිඳු අණින් විස බානවැනි.

85 දත් හී වත් හැකිල-නෙත් කෙස් සුදුව ගතරැලිවැටී,
එත් ලී එලිගෙණ-සිත් තරුණබව නොයේ මිනිසුන්.

86 රූසිරි යොවුන්ගුණ-නැණ සියල්ලෙන් නො අඩුවීමුත්,
නොදතොත් සිල්ප සත-සුවඳනැති කැලමල් සමවේ.

87 තමා තනිකරමින්-දෙදෙනෙක් සතුරුවැ වෙසෙත්නම්,
උපදෙසිනි කිසියම්-ඉන්එකෙකු ගත සිතුව සැදේ.

---

උපතත්, උපන්නත්; සතන්, සත්ත්වයන්ගේ; ගුණ, ගුණයන්; වෙනවෙනම, වෙනස්වෙනස්වම; පවතියි, පවත්නේය.

83 සියපණ, ස්වකීයප්‍රාණයද; සුත තඹුන්, පුත්‍රදාරාවන්ද; සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යයද; විකුම්, වික්‍රමයද; පවති, (නිත්‍යයෙන්) පවතියයි; නොසිතව්, චින්තනයනොකරව්; නුවණැසිනි, ඥානචක්ෂුසින්; විමසාබැලුව, සලකාබැලුවහොත්; සීනෙන්, ස්වප්නයෙන්; ලත්, ලැබුවාවූ; ඉසුරුවැනි, ඓශ්වර්‍ය්‍යයක් වැන්නේය.

84 දුකක්, යම්කිසිදුඃඛයක්; සැලසුනුසත, සැලසුනාවූ සත්ත්වයෝ; තෙදැතියන්, තෙජස්ඇත්තන්ගේ; නමකියා, නාමයකියා; ගැලවෙත්, ගලවෙත්නෝය; සපුත්, සර්පයන්විසින්; සත, සත්ත්වයන්; ඬැහැකල, දෂ්ටකළකල්හි; ගුරුළිඳු, ගුරුළුරාජයාගේ; අණින්, ආඥාවෙන්; විසබානවැනි, විෂබස්වනමෙනි.

85 දත් දන්තයන්; හී, පතිනව (හෙවත්) වැටී; වත්නෙත්, චක්ෂුනෙත්‍රයන්; හැකිල, ඇකිලී; කෙස්, කෙශයන්; සුදුව, ශුභ්‍රව; ගත, ශරීරය; රැලිවැටී, මස්හැකිලී රැලිවැටී; ලීඑලීගෙණ, සැරයටියෙහි එල්බගෙණ; එත්, එන්නේ නමුත්; මිනිසුන්, මනුෂ්‍යයන්ගේ; සිත්, චිත්තයෙහි; තරුණබව, යෞවන භාවය; නොයේ,පහනොවේ.

86 රූසිරි, රූපශ්‍රීයද; යොවුන්, යෞවනයද; ගුණ, (මානුෂික) ගුණයද, නැණ, ඥානයද යන; සියල්ලෙන්, මෙසියලුදෙයින්; නොඅඩුවීමුත්, අනූනවීනමුත්, සිල්පසත; ශිල්පශාස්ත්‍රයන්; නොදතොත්, නොදත්තේනම්; සුවඳනැති, සුගන්ධනැත්තාවූ; කැලමල්සමවේ, කැලමල්හා සමානවේ.

87 තමා, තමන්; තනිකරමින්, හුදකලා කරමින්; දෙදෙනෙක්, ජනයෝ දෙදෙනෙක්; සතුරුවැ, හතුරෝවැ; වෙසෙත්නම්, වාසය

88 දියතුළෙහිදී මුත්-ගොඩපත් කිඹුලුන් දිය නොලබත්,
එමෙන් අරණ්වල-උන් රුපුන් නොනසත් තැන්පත්තෝ.

89 ඔවාදෙනු පරහට-තමා සම්මතෙහි පිහිටාසිට,
දුසිරිත දනන්දෙන-ඔවා වැද්දන් කියන බණවැනි.

90 තමහට නොසරිවන-සබාමැද ඉඳිනුව කරබා,
සඳ දුක කොඳ පුබුදු-වනදුක පියුම් හැකිලෙනමෙන්-

91 නොයව් සබමැදයට-යම්සේ පැමිනියන් නොදෙනුබස්,
කියන මැදහත්වව්-අන්නැකියා නිරයේ නොවැටෙව්.

92 අවිදුන්ට කිසියම්-සලසා පමණ කර ඉඳින සත්,
වලත් කරණ මැටි-තබා බඳුන් කාරණෙව් වැල්ලෙන්.

---

කරත්නම්; යම්කිසි උපදෙසිනි, යම්කිසි උපදෙශයකින්; ඉන්එකො
කු, ඉන්එක්කෙනෙක්; ගන, තමන්අතට ගත්තේනම්; සිතුව, විනාශා
ව; සෑදේ, සිඩවේ.

88 දියතුළෙහිදීමුත්, ජලාභ්‍යන්තරයෙහිදී මිස; ගොඩපත්, තලය
ටපැමිනියාවූ; කිඹුලුන්, කුම්භීලයෝ; දිය, ජයක්; නොලබත්, නො
ලබත්නෝය; එමෙන්, එපරිද්දෙන්ම; අරණ්වල, ආරණ්‍යවල; උන්
රුපුන්, උන්නාවූ සතුරන්; තැන්පත්තෝ, තනතුරුලත්උතුමෝ;
නොනසත්, නොනසති.

89 තමා, ආත්මවාචීහු; සම්මතෙහි, සම්මත (ධර්ම)යෙහි; පිහිටාසිට,
ප්‍රතිෂ්ඨිතව සිට; පරහට, අන්‍යයන්ට; ඔවාදෙනු, අවාදදානය කර
න්නේය; දුසිරිතදනන්දෙන, දුශ්චරිත ජනයන්විසින් දෙන්නාවූ;
ඔවා, අවවාදය; වැද්දන්කියන, ව්‍යාධයන් විසින් කියන්නාවූ; බණ
වැනි; ධර්මයක් සමානය.

90 සඳදුක, චන්ද්‍රසාදෘකීමෙන්; පුබුදුවන, ප්‍රබොධවන්නාවූ; කොඳ
දුක, කුන්දදර්ශිනව්; හැකිලෙන, සංකුචිතවන්නාවූ; පියුම්මෙන්, පද්ම
සෙයින්; තමහට, තමන්ට; නොසරිවන, සමානනොවන්නාවූ; සබ
මැද, සභාමධ්‍යයෙහි; කරබා,!ගෙළහෙළාගෙණ; ඉඳිනුව, ඉන්නේය.

91 යම්සේ, යම්හෙයකින්; පැමිනියන්, සම්ප්‍රාප්තවූවන්ගේ; සබ
මැදයට, සභාමධ්‍යයට; නොයව්, නොපැමිනෙව්; නොදෙනුබස්, වච
න නොකියන්නේ; කියත, සභායෙහි වචන!කියනකල; මැදහත්වව්,
මධ්‍යස්ථවෙව්; අන්නැකියා, අන්‍යායක් කථනයකොට; නිරයේ, නර
කයෙහි; නොවැටෙව්, පතිතනොවෙව්.

92 අවිදුන්ට, අඥනයන්ට; කිසියම්, යම් කිසිකාරණයක් හෝ කා
ටයුත්තක්; සලසා, සලස්වා; පමණකර, ඒප්‍රමාණකොට; ඉඳින, ඉන්
නාවූ; සත්, සත්වයෝ; වලත්කරණ, වලන්සාදන්නාවූ; මැටිතබා,

93 සුදන සහ වීමට-වැඩිය යහපති සොරුන් ඉතකම්,
සොරුදන පැහැරයෙත්-සුදන මන තුට රැගෙණයනුවෙත්.
94 තදරුදු ගුණැතිහට-තදරුදු කෙනෙකි පිහිටවන්නේ,
සඳට වයිර්වී-සොරුනට අඳුරු පිහිට වනුමෙනි.
95 සුරතුර බඳුරු කල-සිතුමිණි සුරබිදෙනු සිරිදෙනු,
තෙරුවන් වැඳ අදර-කළ සතහට සව්සිරින් මොක්වේ.
96 සී ගජ රන් රුවන්-නා ලිය පුවත් සත්දත්,
සත් යම්රටෙකයත්-අදර කෙරෙ සත් නොමද සතුටින්.
97 සිත්නැති ගල්ගුහා-පවා තපසුන්ට පිහිට වේ.
දෙලොවෙහි වැඩ දැනත්-ලෙව් නොරකිද්ද වියතුනි.

---

මාණිකාහැර; වැල්ලෙන්, වාලුකායෙන්; බඳුන්, භාජනයන්; කරණෙව්, සාදන්නා මෙනි.

93 සුදන, සුජනයන්හා; සහවීමටවැඩිය, සහායවීමටවඩා; සොරුන්, චෞරයන්හා; ඉතකම්, හිතවිශ්වාසය; යහපති, යහපත්වන්නේය; සොරු, චෞරයෝ; දන, වස්තුව; පැහැරයෙත්, පැහැරගෙණයත්; සුදන, සුජනයෝ; මනතුට, චිත්තසන්තොෂය; රැගෙණ, ග්‍රහණයකොට; යනුවෙත්, යන්නෝවෙත්.

94 තද, දැඩිවූ; රුදුගුණැතිහට, රෞද්‍රගුණ ඇත්තාට; පිහිටවන්නේ, ප්‍රතිෂ්ඨාවන්නේ; තද, දැඩිවූ; රුදුකෙනෙකි, රෞද්‍රකෙනෙක්මය; සඳට, චන්ද්‍රයාට; වයිරිවී, වෛරව; අඳුරු, අන්ධකාරය; සොරුනට, චෞරයන්ට; පිහිටවනුමෙනි, ප්‍රතිෂ්ඨාවන්නා සේයි.

95 සුරතුර, දිව්‍යකල්පවෘක්ෂයද; බඳුරුකල, භද්‍රඝටයද; සිතුමිණි, චින්තාමාණික්‍යයද; සුරබිදෙනු, සුරභිධෙනුවද; සිරි, ඓශ්වර්‍ය්‍ය; දෙනු, දෙන්නේය; තෙරුවන්, ත්‍රිවිධරත්නය; වැඳ, වන්දනාකොට; අදරකළ, ආදරකළාවූ; සතහට, සත්වයන්ට; සව්සිරින්, සකලෛශ්වර්‍ය්‍ය ලැබීමහා; මොක්වේ, (අන්තයෙහි) සසරින් මිදීමත් වේ.

96 සී, සිංහයන්ද; ගජ, හස්තීන්ද; රන්, ස්වර්ණද; රුවන්, (මාණික්‍යාදි) රත්නයන්ද; නා, නාගයන්ද; ලිය, ස්ත්‍රීන්ද; පුවත්, ප්‍රසිද්ධයන්ද; සත්දත්සත්, ශාස්ත්‍රදන්තන්ද (යන මේ සචේතන අචේතන වස්තු); යම්රටෙක, යම්රටකට; යත්, යනකල; සත්, සත්වවර්ගයා; සතුටින්, සන්තොෂයෙන්; නොමද, බොහෝවූ; අදරකෙරේ; ආදරකරන්නේය.

97 සිතනැති, චිත්තයක් නැත්තාවූ; ගල්ගුහාපවා, ගල්ලෙන්පවා; තපසුන්ට, තාපසයන්ට; පිහිටවේ, උපකාරවන්නේය; වියතුනි, ව්‍යක්තයෙනි; ලෙව්, ලොකයා; දෙලොවෙහි, උභයලොකයෙහි; වැඩ, අර්ථයන්; දැනත්, අවබොධකොටත්; නොරකිද්ද; (තාපසයන්) රක්ෂනාකරත්ද.

98 මහපින් ඇති දනෝ–උතුම්වෙත් ඉසුරෙන් සුරන්ටත්,
නරවෙසිනි සක්පුර–රජනොකළේද මන්ධාතුරජ.

99 නයගැන්ම ගමබිම–විකිණීමහතුන් වෙරව අන්දෙස්,
මේ පස කළ සතන්–කුලය නසනේ පසඬ සඳමෙන්.

100 තෙදැතියහට විරිදු–ගුණැතිය හැර නොයෙත් දුර,
නුබම්ණට ගනඳුර–බිඳෙන සඳසහ වසනවිලසින්.

101 ඇතිතෙක්ම කඩතෙල්–අඳුරැඳුරහැර පහනබැබලේ,
පින්ඇතිතෙක් දනෝ–සව්සිරින් පරසිදුව බබලන.

102 උතුමෝ පවා ලොව–නිවැරදි සතන්නමුත් බඳවත්,
කලවරදට අසුර–දියරම් නොබැඳවීද සමුදුර.

---

98 මහපින්ඇති, මහත් පුණ්‍යඇත්තාවූ; දනෝ, ජනයෝ; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; සුරන්ටත්, දෙවියන්ටත්; උතුම්වෙත්, උත්තම වෙති; නරවෙසිනි, මනුෂ්‍යවෙශයෙන්; සක්පුර, ශක්‍රපුරයෙහි; මන්ධාතුරජ, මහාමන්ධාතුරජතෙමේ; රජනොකෙළේද; රාජ්‍යය නොකළේද (කළේමය.)

99 නයගැන්ම, (අනුන්ගෙන් ධන) නයටගැනීමද; ගමබිම, ග්‍රාම භූමි; විකිණී, විකිණීමද; මහතුන්වෙරව, මහත්මයන්ට වෛරවිසීමද; අන්දෙස්, අන්‍යයන්ගේ දොෂ (ප්‍රකාශකිරීමද;) මේපස, මේපඤ්චකය; කළ, කරණලද්දාවූ; සතන්, සත්වයන්විසින්; පසඅඬ, පශ්චිමඅර්ධයෙහි (හෙවත්) කලුවරපක්ෂයෙහි; සඳමෙන්, චන්ද්‍රයාසෙයින්; කුලය, වංශය; නසනේ, නසනුලැබෙයි.

100 තෙදැතියහට, තෙජස්ඇත්තන්ට; විරිද්‍ධ, විරුඬවූවෝ; ගුණැතියහැර, ගුණඇත්තන් පහකොට; දුරනොයෙත්, දුරටනොයති; නුබම්ණට, සූර්‍ය්‍යයාට; බිඳෙන,භග්නවන්නාවූ; ගනඳුරු; ඝනාන්‍ධකාරය; සඳසහ, චන්ද්‍රයාහා; වසනවිලසින්, වාසයකරන්නාසෙයිනි.

101 පහන, ප්‍රදීපයතෙම; කඩතෙල්, කඩවැටිහා තෛලයන්; ඇතිතෙක්ම, ඇතිතාක්ම; අඳුරැඳුරහැර, අන්‍ධකාරය පහකොට; බැබලේ, බැබලෙන්නේය; දනෝ, ජනයෝතුමූ; පින්ඇතිතෙක්, පුණ්‍ය ඇතිතාක්; සව්සිරිනි, සකලෛශ්වර්‍ය්‍යයෙන්; පරසිදුව, ප්‍රසිඬව; බබලත්, බබලත්නෝය.

102 ලොව, ලොකයෙහි; උතුමෝපවා, උත්තමයෝත්; නිවැරදිසතන් නමුත්,වරදනැති සත්වයන්නමුත්;'බඳවත්, (සම්කරුණකින්) බන්‍ධනයකරවත්; අසුර, අසුරයන්විසින්; කළ, කරණලද්දාවූ; වරදට, වරද්‍යයට; රම්, රාමකුමාරතෙම; සමුදුර, සමුද්‍රයෙහි; දිය, ජලයෙ; නොබැඳවීද, බන්‍ධනයනොකරවීද. (කරවීමැයි.)

103 හැමසැපම ඇතිතැන්-මුලුලොවම නැති නැණින් බැලුවත්,
කප්තුරු පවාඇති-උතුරුකුරු දිව යකුන් බියවේ.

104 සව්සිප් දත් වියත්-පඬිවරවෙතට පැමිනි අවියත්,
පහනරිවි පහනේ-අබිමුවෙහි පහනෙව් නොබබලත්.

105 පින් පව් කළ සතන්-එකතැනදීම බලාගන්නේ,
යාන වාහනවල-හිඳිනවුන් සමහරෙක් උසුලත්.

106 නීතයෝ වැඩබස්-කිවත් නොඅසත් අසත් සුදනෝ,
නො අසත් ගැරඬි මතුරු-අසත් උරගිඳු නරන් දපකළ.

107 සබාබීරුකවු-නැණැතිය උගත් නොමද සොඳසිප්,
රුපු අබිමුවට පත්-දුබලයෙකු අත අනගි අවිවැනි.

---

103 හැමසැපම, සියලුසම්පත්තියම; ඇතිතැන්, ඇත්තාවූස්ථාන; මුලුලොවම; සියලු ලොකයෙහිම; නැණින්, ඥනයෙන්; බැලුවත්, නිරීක්ෂණයකළත්; නැති, නැත්තේය; කප්තුරුපවා, කල්පවෘක්ෂපවා; ඇති, විද්‍යමානවූ; උතුරුකුරුදිව, උත්තරකුරුනම් ද්වීපයෙහි; යකුන්, යක්ෂයන්ගෙන්; බිය, භය; වේ, වන්නේයි.

104 සව්සිප්, සකලශිල්පයන්; දත්, දැනගත්තාවූ; වියත්, ව්‍යක්තවූ; පඬිවරවෙතට, පණ්ඩිතයන්සමීපයට; පැමිනි, සම්ප්‍රාප්තවූ; අවියත්, අව්‍යක්තයෝ; පහන, ප්‍රසන්නවූ; (හෙවත්) දූඩිවූ; පහනේ, ප්‍රභාඇති; රිවි, සූර්‍ය්‍යයාගේ; අබිමුවෙහි; අභිමුඛයෙහි; පහනෙව්,ප්‍රදීපයන්සේ; නොබබලත්, නොබබලන්නාහුය.

105 පින්පව්, පුණ්‍යපාපයන්; කළ, කළාවූ; සතන්, සත්වයන්; එකතැනදීම, එකස්ථානයෙහිදීම; බලාගන්නේ, නිරීක්ෂණය කරන්නේය; යානවාහනවල, යානවාහනයන්හි; හිඳිනවුන්, ඉන්නාවුන්; සමහරෙක්; කිසිවෙක්, උසුලත්; උවහනයකරත්.

106 වැඩබස්, අභිවෘද්ධ්‍යත්මවචන; කිවත්, කියේනමුත්; නීතයෝ, හීනජනයෙ!; නොඅසත්, ශ්‍රවණයනොකරත්; සුදනෝ, යහපත්ජනයෝ; අසත්, ශ්‍රවණයකරත්; නරන්, මිනිසුන්විසින්; දපකළ, ජපකරණ ලද්දාවූ; මතුරු, මන්ත්‍රය; ගැරිඬි,ගැරඬිහු; නොඅසත්,නොඅසති; උරගිඳු, නාගෙන්ද්‍රයෝ; අසත්, අසති (හෙවත්) නොඉක්මවති.

107 සබාබීරුකවු, සභාවට බානසුලුවූ; නැණැතිය, ප්‍රඥවන්තයා; නොමද, බොහෝකොට; උගත්, උද්ග්‍රහණයකළාවූ; සොඳ, සුන්දරවූ; සිප්, ශිල්පහෝ ශාස්ත්‍ර; රුපු, සතුරන්ගේ; අබිමුවටපත්, අභිමුඛයටපැමිනියාවූ; දුබලයෙකු, දුර්වලයෙකුගේ; අත, හස්තයෙහි; අනගි, අනර්ඝවූ; අවිවැනි, ආයුධසමානයි.

108 කිසිඳම් කම් කරව්-නුවණින් බලා විමසා,
එකකට පටන් ගෙණ-පසුවිඳැ නැවෙනුවෝ අවිදූවෙත්.

109 නුපුලුවන් කිසිකම්-කරලාගෙණ සැපෙන අවියත්,
තමා තම කරටම-නැගෙනුව පයත්නය කරණවැනි.

110 පිණින් පැමුනුනු දෙය-මදය සිතා ඉසුරු පතනුවෝ,
උවදුරු ඇතිගඟේ-පීනුම් නොදන පනිනවුන් වැනි.

111 උසරුකට නොනැගෙව්-තමබල විතරටම වදන් දෙව්,
නුවණැතියන් වදන්-ගණිව් නොගණිව් නොමිනිසුන් බස්.

112 රෑදින දිවාමැද-තනියම පරගනන් සොරුන් පසු,
නොයව් ගිය අවැඩක්-පැමිනේය දනු සතුනි සැකනැති.

---

108 කිසියම්කම්, කිසියම්කටයුත්තක් (කරන්නේ); නුවණින්, ඥනයෙන්; විමසාබලා, පරීක්ෂාකොටබලා; කරව්, ආරම්භකරව්; එකකට, එක්කටයුත්තක්; පටන්ගෙණඉඳ, (කරන්ට) පටන්ගෙණ හිඳිමින්; පසුව, පශ්චාත්කාලයෙහි; නැවෙනුවෝ, නාපවත්නෝ; අවිදුවෙත්, අඥනයෝ වන්නාහුය.

109 නුපුලුවන්, නොහැකිවූ; කිසිකම්, යම්කිසි කර්මයක්; කරලා ගෙණ, හසනයෙහිබහාගෙණ (හෙවත්) ගෙලෙහිලාගෙණ; සැපෙන, හැපෙන්නාවූ; අවියත්, අව්‍යක්තයෝ; තමා, තෙමේම; තමකරටම, තමන්ගේ උරයටම; නැගෙනුව, ආරූඪ වන පිණිස; පයත්නයකරණ වැනි, ප්‍රයත්න කරන්නාසමානයි.

110 පිණින්, පුණ්‍යකරණකොටගෙණ; පැමුනුනු, සම්ප්‍රාප්තවූ; දෙය, ද්‍රව්‍යය හෝ වස්තුව; මදයසිතා, මන්දයයි චින්තනයකොට; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; පතනුවෝ, ප්‍රාර්ථනාකරන්නෝ; උවදුරු, උපද්‍රව; ඇති, ඇත්තාවූ; ගඟේ, ගංගාවෙහි; පීනුම්නොදන, පීනීම නොමදන; පනිනවුන්වැනි, පනින්නවුන් සමානයි.

111 උස, උස්වූ; රුකට, වෘක්ෂයට; නොනැගෙව්, ආරූඪනොවව්; තම, තමන්ගේ; බලවිතරටම, බලප්‍රමාණයටම; වදන්, වචන; දෙව්, දානයකරව්; නුවණැතියන්, ප්‍රඥවන්තයන්ගේ; වදන්, වචනයන්; ගණිව්, ග්‍රහණයකරව්; නොමිනිසුන්බස්, අමනුෂ්‍යයන්ගේ (හෙවත්) අපණ්ඩිතයන්ගේ වචන්; නොගණිව්, ග්‍රහණය නොකරව්.

112 සතුනි, සත්‍යයෙනි; දින, දවසසම්බන්ධවූ; රෑදිවාමැද, රාත්‍රිදහවල් මධ්‍යයෙහි; තනියම, හුදකලාවම; පරගනන්, පරස්ත්‍රීන්ද; සොරුන්, චෞරයන්ද; පසු, පස්සෙහි; නොයව්, ගමන්නොකරව්; ගිය, ගමන් කලේනම්; අවැඩක්, අනර්ථයක්; පැමිනේ, සම්ප්‍රාප්තවේ; සැකනැති, (මෙහි) සඞ්කාවක්නැත්තේය; දනු, (මෙය) දැනගණු.

113 දුටත් රත් රන් ඇණ–රණැයි නස්නා විනා නොදූනේ,
නිමලවනෙත් ඇතත්–රුවන් නොපෙනේ දින මිණෙන්මෙන්.

114 දනවත් තැනට ලගු–වත් දීමෙනුත් ලබත් දන දන,
ලොවඳුරුහළ හිරුට–කරණ පුදයෙහි පහන් ලන වැනි.

115 තවසුන් ගුරුන්තම–දෙගුරුන් පඬිවරන් සුරන්හට,
නොම කොට බැති අදර–නින්ද කරණුහට නොවේවැඩ.

116 කුළුදෙස්ද කේලාම්–බොරු උඬගු බස් සතට නින්ද,
අනගය මුසුකතා–කුරිරු බස් නොකියව්ව නැසෙතත්.

117 නොමද අකුසල් කොට–අවිදු විදුවූ සත කරණ පින්,
දුගඳවූ වළෙහිසිට–ඇඟපිට සුවඳ අලෙව් කරණ වැනි·

---

113 රත්රන්ඇණ, කාංචනආණීන්; දුටත්, දුටුයේනමුත්; නස්නා විනා, උරගැමෙන්වෙන්ව; රණැයි, ස්වර්ණයයි; නොදූනේ, නොම දූනෙන්නේය; නෙත්, නෙත්‍රයන්; නිමලව, නිර්මලව; ඇතත්, ඇත්තේනමුත්; රුවන්, රත්නයන්; දිනමිණෙන්මෙන්, සූර්‍ය්‍යයා කරණ කොටගෙණ සෙයින්; නොපෙනේ, නොපෙනෙන්නේය.

114 දනවත්තැනට, ධනවත්ත තැනැත්තාහට; ලගු, ළඟුවූ; වත්, වස්තු; දීමෙනුත්, දානයකිරීමෙනුත්; දන, ජනයෝ; දන, වස්තුව; ලබත්, ලබන්නාහුය; ලොව, ලොකයෙහි; අඳුරුහළ, අන්ධකාර දුරුකළාවූ, හිරුට, සූර්‍ය්‍යයාට; කරණපුදයෙහි, කරන්නාවූ පූජායෙහි; පහන්, ප්‍රදීපයන්; ලනවැනි, දල්වන්නාමෙනි.

115 තවසුන්, තාපසයන්ටද; ගුරුන්, ආචාර්‍ය්‍යවරයන්ටද; තම දෙගුරුන්, තමන්ගේ දෙමව්පියන්ටද; පඬිවරන්, පණ්ඩිතවරයන්ටද; සුරන්හට, දෙවියන්ටද; අදරබැනි, ආදරභක්ති; නොකොට, නොකර; නින්දකරණුහට, නින්දාකරන්නාට; වැඩනොවේ, අභිවෘද්ධියක් නොවන්නේය.

116 කුළුදෙස්, කූටසාක්ෂි (හෙවත්) බොරුසාක්ෂිද; කේලාම්, පෛශුන්‍යද; බොරු, මුසාවාදද; උඬගුබස්, උද්ධතවචනද; සතටනින්ද, සත්ත්වයන්ට නින්දාකරණ වචනද; අනගයමුසුකතා, රාගනිශ්‍රිතකථාද; කුරිරුබස්, ක්‍රූරවචනද, නැසෙතත්, මියෙත්නමුත්; නොකියව්ව, කථනය නොකරව්.

117 විදුඅවිදුවූසත, පණ්ඩිත අපණ්ඩිතවූ සත්වයෝ; නොමද, බොහෝවූ; අකුසල්කොට, පාපයන්කර; කරණපින්, (යලි) කරන්නාවූ පුණ්‍යයන්; දුගඳවූවළෙහිසිට, දුර්ගන්ධ ආවාටයෙක්හි සිටිනව; ඇඟපිට, ශරීරමතුයෙහි; සුවඳ, සුගන්ධයන්; අලෙව්කරණබැනි, ආලෙපකරන්නා සමානයි.

118 නොකා නොබී ඉසුරු–තිබුවොත් පිණැතිහට පැමිනේ,
ගොදුරෙහි රසයෙදූ–දසන්හැර දිව රස විඳිනමෙන්.

119 සව් ඉසුරු අඩුවැඩි–වේය ගුණනැණැති උතුමන්ටත්,
සත අද නද කරණ–සුපුන්සඳ අඩුවැඩී වනමෙන්.

120 දහම්දන විදුසොඳ–අබයවත් බත් බුලත් කරපෙම්,
දෙත මෙකී දනදන–දනයයි ලෙව් කියති පඬුවෝ.

121 රාජවිල් නෙත්තන්–කෙළන දනහා දූත අඟනන්,
සොරුන් රාසොඬුනුත්–මොවුන් සෙව්වන් නැසෙති නියතයි.

122 නුවණැසෙකි සුවියත්–සත සමගවනු ඇසෙකි දනහා,
නොනැසෙන මෙඇස්දෙක–නැති සතනොමග යනුකොදවරද.

---

118 නොකානොබී, නොමකා නොමපානයකොට; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; තිබුවොත්, තැබූයේනම්; පිණැතිහට, පුණ්‍යවන්තයන්ට; පැමිනේ, (එය) සමප්‍රාප්තවේ (නොහොත්) අයිතිවේ; ගොදුරෙහි, ගොචරයෙහි (හෙවත්) ආහාරයෙහි; රස, රසයන්; යෙදූ, යොජිතකළාවූ; දසන්හැර, දන්තයන් ඉක්මගොස්; දිව, ජිහ්වාතොම; රසවිඳින මෙන්, රසය විඳින්නාමෙනි,

119 ගුණනැණැති, ගුණනුවණඇත්තාවූ; උතුමන්ටත්, උත්තමයන්ටත්; සව්ඉසුරු, සකලෛශ්වර්‍ය්‍ය; අඩුවැඩිවේය, ඌනාතිරෙකවන්නේය; සත, සත්වයන්ගේ; අද, චින්තය; නදකරණ, සන්තොෂකරන්නාවූ; සුපුන්සඳ, සම්පූර්ණචන්ද්‍රයා; අඩුවැඩියි වනමෙන්, ඌනාතිරෙක වන්නාමෙනි.

120 දහම්, (දෙශනාකිරීම්වශයෙන්) ධර්‍මය ද; දන, ධනයද; සොඳවිදු, සුන්දර විද්‍යාවන්ද; අබය, නිර්භයද; වත්, වස්ත්‍රයන්ද; බත, භක්තයන්ද; බුලත්, තාම්බූලද (යන); මෙකීදන, මේකීවාවූ වස්තූන්; දන, ජනතෙමේ; කරපෙම්, ප්‍රෙමකොට; දෙත, දේනම්; ලෙව්, ලොකයෙහි; පඬුවෝ, පණ්ඩිතයෝ; දනයයි, (ඒදීම) දානනම් වන්නේයයි; කියති, ප්‍රකාශකරති.

121 රාජ; රජුද; විල්, තටාකයන්ද; නෙත්තන්, නෘත්‍යකාරයන්ද; දූතඅඟනන්, ධූර්තස්ත්‍රීන්ද; සොරුන්, චෞරයන්ද; රාසොඬුන්, සුරාසොඬයන්ද; කෙළිනදනහා, ක්‍රීඩාතත්පරයන්ද (යන), මොවුන්, මෙකීවන්; සෙව්වන්, (නොතරමින්) සෙවනයකළාහු: නැසෙති, විනාශවෙති; නියතයි, (මෙය) නිශ්චිතයි.

122 සුවියත්, ඉතාව්‍යක්තවූ; සතසමගවනු, සත්වයන්හා සමගිවීම; නුවණැසෙකි, ඥානචක්ෂුසකි; දනහා, සෙසුජනයන්හා සමගිවීම; ඇසෙකි, අන්‍යචක්ෂුසකි; නොනැසෙන, (තමහට) විනාශනොපැමිනෙන්නාවූ; මෙ ඇස්දෙක, මේවිප්‍රකාර චක්ෂුස්ම; නැතිසත; නොමැති සත්වයෝ; නොමගයනු, නොමගපිළිපැදීම; කොදවරද, කවර වරදද.

123 දුදන සහ මිතුරුව-ඉඳින නොදැනුම්විතරට,
ගුණ නැණැති සුදනන්-සමග සතුරුව උනත් වැඩවේ.

124 නොමද පිරිවර යස-ඇතත් වලකන්ට බැරිවන දෙය,
තරුසෙන් පිරිවැරූ-සුපුන්සඳ රාහු ගහණ නොකෙරෙද.

125 අදමින් ලත් ඉසුරු-නොපවති සොරුසෙවූ දනමෙන්,
දහමින් ලත් ඉසුරු-සැපත් සුරනිඳු ලත් ඉසුරු වැනිවේ.

126 වැව් අමුනු පිරිදිය-පිටවාණ හැර සුරැකි කලමෙන්,
දනවත් නැණැතියෙනි-දන්දී දෙලෙව් වැඩසිදුකරව්.

127 ගුරුනිරිඳු මිතුරන්-ලිය ලිය මව් මෙකීවන්,
තම මව් ලෙස සිතා-පවතිත් නැණැති සුදනෝ.

---

123 දුදනසහ, දුර්ජනයන්හා; මිතුරුව, මිත්‍රව; ඉඳින, වාසයකරන්නාවූ; නොදැනුම්, නොදැනීම; විතරට, ප්‍රමාණයට; ගුණනැණැති, ගුණනුවණ ඇත්තාවූ; සුදනන්සමග, හුදීජනයන්හා; සතුරුව, ශත්‍රුව; උනත්, උන්නමුත්; වැඩවේ, අභිවෘද්ධියවේ.

124 නොමද, බොහෝවූ; පිරිවර, පරිවාරයන්හා; යස, යශො(රාශිය); ඇතත්, ඇත්නමුත්; වනදෙය, වන්නාවූදෙය(හෙවත්) වියයුත්ත; වලකන්ටබැරි, වැළකියනොහැක්කේය; තරුසෙන්, තාරකාසමූහය විසින්; පිරිවැරූ, පිරිවරණලද්දාවූ; සුපුන්සඳ, පිරිපුන්සඳු; රාහු, රාහුතෙමේ; ගහණනොකෙරෙද, ග්‍රහණනොකරන්නේද.

125 අදමින්, අධර්මයෙන්; ලත්ඉසුරු, ලැබූ ඓශ්වර්ය්‍යය; සොරු, චෞරයන් විසින්; සෙවූ, උපයනලද්දාවූ; දනමෙන්, වස්තුපරිද්දෙන්; නොපවති, නොපවත්නේය; දහමින්, ධර්මයෙන්; ලත්ඉසුරුසැපත්, ලැබූ ඓශ්වර්ය්‍ය සම්පත්තිය; සුරනිඳු, ශක්‍රයාවිසින්; ලත්ඉසුරුවැනිවේ, ලබනලද ඓශ්වර්ය්‍ය සමානවේ.

126 දියපිරි, (වැඩි) ජලයපිරුණාවූ; වැව් අමුනු, වාපික්ෂෙත්‍රබන්ධනයන්; පිටවාණහැර, (වැඩිජලයහරිණා) බහිමාතිකාවතබා; සුරැකි කලමෙන්, මනාකොට රක්නාකලක් පරිද්දෙන්; දනවත්, ධනවන්තවූ; නැණැතියෙනි, ඥානවන්තයෙනි; දන්දී, (දියයුත්තන්කෙරෙහි)දානයකොට; දෙලෙව්වැඩ, උභයලොකාර්ථය; සිදුකරව්, සිද්ධකරව්.

127 ගුරු, ගුරුන්ගේද; නිරිඳු, රජුන්ගේද; මිතුරන්, මිත්‍රයන්ගේද; ලිය, භාර්ය්‍යාවන්හා; ලියමව්, තමසොඳුරගේ මවද යන; මෙකීවන්, මේ කීවන්; තමමව්ලෙස, තමන්මැණියන්සේ; සිතා, සලකා; නැණැතිසුදනෝ, නැණවත් හුදීජනයෝ; පවතිත්, ප්‍රවර්ත්තිතවෙත්.

128 නිදනහට දෙන දෙය-මයි ලොවෙහි උතුම් වියතුනි,
ඉසුරුමත්හට දෙන-දෙය වපුරණවැනි කෙතෙහි බිජු.

129 තරසරව වැටකළ-කෙතට සිව්පා නොවදිනාමෙන්,
පිරිසිදුව පින්කළ-සතුන්හට දුක්නොවේ කලෙකත්.

130 දළ අත්නියවිසැති-සත දුදන ලිය රදුන් සිඟු ගං,
කෙළෙනම් කාකිවත්-කෙරේ අපදා පමණනොකරව්.

131 ලොබදෙස් මොමදමත්-සතහට තපස්කම් නැති,
මෙකී සිව්ගුණ නොමැති-සතහටත් තපස්කම් නොමඇති.

---

128 වියතුනි, ව්‍යක්තයෙනි; ලොවෙහි, ලොකයෙහි; උතුම්, උත්තමනම්; නිදනහට, නිර්ධනීන්ට; දෙනදෙයමයි, දානයකරණදෙයමැයි; ඉසුරුමත්හට, ඓශ්වර්‍ය්‍යමතුන්ට; දෙනදෙය, දානයකරණ ද්‍රව්‍යය; කෙතෙහි, ක්‍ෂෙත්‍රයෙහි; බිජු, බීජයන්; වපුරණවැනි, වාපනයකිරීම සමානයි.

129 තරසරව, ස්ථිරසාරව; වැටකළ, වෘතිබන්ධනයකළාවූ; කෙතට, ක්‍ෂෙත්‍රයට; සිව්පා, චතුස්පදීහු; නොවදිනාමෙන්, ප්‍රවිෂ්ටනොවන්නාසේ; පිරිසිදුව, පරිශුද්ධව; පින්කළ, පුණ්‍යකර්ම කළාවූ; සතන්හට, සත්වයන්ට; කලෙකත්, කාලයකත්; දුක්, දුඃඛයක්; නොවේ, නොවන්නේය.

130 දළ, දන්තයන්ද; අත්නිය, හස්තයෙහි නඛයන්ද; විස, විෂද; ඇතිසත, ඇත්තාවූ සත්වයන්හා; දුදන, දුර්ජනයන්ද; ලිය, ස්ත්‍රීන්ද; රදුන්, රජුන්ද; සිඟු, අංඇතියන්ද; ගං, ගඞ්ගාවන්ද යන මෙකීවන්හා; කෙලෙනම්, ක්‍රීඩාකෙළේනම්; කාකිවත්, (වරදනැතැයි) කවරෙක් කී නමුත්; අපදා, ව්‍යසනයන්; කෙරේ, කෙරේමය;(එහෙයින්)පමණනොකරව්; (විශ්වාසයයි) ප්‍රමාණ නො කරව්.

131 ලොබ, ලොභඇත්තාවූද; දෙස්, ද්වෙෂඇත්තාවූද; මෝ, මොහයෙන් මුළාවූද; මදමත්, මදයෙන්මත්වූහෝ පුරුෂමද ඓශ්වර්‍ය්‍යමද්දිය ඇත්තාවූද; (යනමේ) සතහට, සත්වයන්ටත්; තපස්කම්, තාපසකම්, නැති, නැත්තේය; මෙකීසිව්ගුණ, මේකියනලද සතරවැදෑරුම් ස්වභාගුණයන්; නොමැති, නැත්තාවූ; සතහටත්, සත්වයන්ටත්; තපස්කම්, තාපසකර්මයන්; නොමඇති, නොමැත්තේය. *

---

* ලොභද්වෙෂමොහ මදයන් යනමේ පාපකොටස් යමෙක් මැඩනොපවත්වානම් ඔහටත් තපස්ගුණයක් නැත්තේය-මෙකීපාප කොටස් යමෙකුට නැත්තේනම් මේ ආදි පාපකොටස් නැතිකිරීම පිණිස ඔහු විසින් කළයුතු තාපසකර්ම නැතිනිසා ඔහුටත් තපස්කම් නැත්තේය-යනුමෙහි භාවයයි.

132 බෝ දරු වදනී දිවි–එකදරු වදන ගව වගාවෙත්,
සත් කැල නසනුවන්–කුලනැසෙත් සත් වග වගාවෙත්.

133 සුරාපානය කල–පව්වුන්ට දෙනු ඔවා මුදුබස්,
දියතුළ වන් එකෙකු–පුලුස්සන වැනි ගිනිසුලක් ලා.

134 සුරා සොඬක නොවී–මිනිස්ගුණැතිව උන් විටෙකවත්,
අනිකෙකු සුරාබී–විඳින දුක් නුදුටුවොද වරෙවත්.

135 නොකා නොදී ඉසුරු–තබා දිවි රකින අය අවියන්,
කෙත රැකවලට බැඳි–මිනිස් රූවැනි නැණින් බැලූකල.

136 සැපයක් යමෙකුගේ–හඬව හඬවා ගතොත් බලයෙන්;
හඬ හඬවා ඔහුත්–ගණිතිසුරු පන්සිය පණස්වර.

---

132 දිවි, දිවිදෙන්නු; බෝදරු, බොහෝදරුවන්, වදනී, ප්‍රසූතකරනී; එකදරුවදනනව, එකදරුවෙක් ප්‍රසූතකරණගවයෝ; වගාවෙත්, (දිවියන්ටවඩා) බෝවෙනී; සත්කැල, සත්ත්වසමූහයා; නසනුවන්, විනාශකරන්නන්ගේ; කුල, වංශය; නැසෙත්, විනාශවෙත්; සත්වග, මනාසත්ත්වයෝ; වගාවෙත්, වඩීනවෙත්.

133 සුරාපානයකල, රහමෙරපීවාවූ; පව්වුන්ට, පාපිකජනයන්ට; මුදුඔවාබස්, මොලොක් අවවාදවදන්; දෙනු, දීම; දියතුළ, ජලාභ්‍යන්තරයට; වන්එකෙකු, ප්‍රවිෂ්ටවූ ඇම්එනෙක්; ගිනිසුලක්ලා, වහනි උල්කාවක් හෙලා; පුලුස්සනවැනි, පිලිස්සීමක් සමානයි.

134 සුරාසොඬකනොවී, රාසොඬක්නොව; මිනිස්ගුණැතිව, මනුෂ්‍යගුණඇතිව; උන්විටෙකවත්, උන්නාවූ වෙලාවකවත්; සුරාබී, රහමෙරපානයකොට; අනිකෙකු, අන්‍යයෙක්; විඳිනදුක්, විඳින්නාවූ දුඃඛයන්; වරෙවත්, දවසකවත්; නුදුටුවොද, නොදුටුකෝද.

135 ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; නොකා, නොම අනුභවකොට; නොදී, (දානාදිවශයෙන්) නොමදී; තබා,(ලොභහෙයින්)සඟවා; දිවිරකින, ජීවිතය රක්‍ෂාකරන්නාවූ; අවියත්අය, අව්‍යක්තමනුෂ්‍යයන්; නැණින් බැලූකල, නුවණින් නිරීක්‍ෂණයකලකල්හි; කෙතරැකවලට, ක්‍ෂෙත්‍රාරක්‍ෂාවපිණිස; බැඳි, බඳිනලද්දාවූ; මිනිස්රූවැනි, මනුෂ්‍යරූප (පඹයෝ)සමානයෝයි.

136 යමෙකුගේ, යම්කිසිවෙක්හුගේ; (අසිතියෙහි පවත්නා); සැපයක්, සම්පත්තියක්; බලයෙන්, බලාත්කාරයෙන්; හඬව හඬවා, රෝදනය කරවමින්; ගතොත්, (පැහැර) ගත්තේනම්; ඔහුත්, ඒ මනුෂ්‍යයාත්; හඬහඬවා, රෝදනයකරවකරවා; පන්සියපණස්වර, පන්සියපණස්වාරයක්; ඉසුරු, (ඔහුසතුක)ඓශ්වර්‍ය්‍යය; ගණිති, (අන්‍යයෝ) පැහැරගණිත්.

137 ලොවට ඉන නොවනා–දෙය කෙරෙති ඉසුරට පැමිනියෝ,
ලොවට උතුම් ගොවිඳු–පවා නය් යහන සැතපෙනුයේ.

138 නිසල නොමවන සත–නොමද සව්සිප් නොයෙක් උගතත්,
සසලගුණ නොහරින්–දියෙහි පිළිබිඹු පෙනෙන සඳමෙන්.

139 මසුරුවූ දනෝදන්–දෙන්ට නොකියති ඇතත් යදිහට,
ගොලුවන්ට මුලුදිය–ඉසුරතත් කතා නොකියනමෙන්.

140 මසුබෝ වරී මුතු–සිපි නොවටි මුතු ලකක්වත්,
එමෙන් ලුහුදනපුත්–පෙරකළ පිණෙන් බබලත්.

141 කම්මැලිහට සිල්ප–නොසිදුවේ එබැවින් නිදනවේ,
නිදනහට මිතුරු නැත්–එහෙයින් සිතට සැපනැත්.

---

137 ඉසුරට, ඓශ්වර්‍ය්‍යයට; පැමිනියෝ, සම්ප්‍රාප්තවූවෝ; ලොවට, ලොකයාහට; ඉතනොවනාදෙය, හිතවැඩපිණිස නොපවත්නාදෙය; කෙරෙති, කරත්; ලොවට, ලොකයාහට; උතුම්, උත්තමවූ; ගොවිඳු පවා, ගොවින්දතෙමේ පවා; නය්යහන, නාගසයනයෙහි; (නය්දරණ වැලපිට) සැතපෙනුයේ, සයනයකරයි.

138 නිසලනොමවන, නිශ්චලනොවන්නාවූ; සත, සත්වයෝ; නොමද, අමන්දවූ; නොයෙක් සව්සිප්, අනෙකාකාර සියලුශිල්පයන්; උගතත්, උගත්නමුත්; සසලගුණ, චපලස්වභාව; දියෙහි, ජලයෙහි; පිළිබිඹු, ප්‍රතිබිම්බය; පෙනෙන, දෘශ්‍යමානවන්නාවූ; සඳමෙන්, චන්ද්‍රයාමෙන්; නොහරින්, පහනොකෙරෙත්.

139 මසුරුවූදනෝ, මසුරුවූමිනිස්සු; ඇතත්, (බොහෝසම්පත්)ඇත්නමුත්; යදිහට, යාචකයාට; දන්දෙන්ට, දානයපිණිස; නොකියති, නොකියත්; ගොලුවන්ට, මූගයන්ට; මුලුදිය, සියලුලොව; ඉසුරුඇතත්, ඓශ්වර්‍ය්‍යය ඇත්නමුත්; කතා නොකියනමෙන්, කථානොකියන්නාමෙනි.

140 මුතු, මුක්තාඵලයෝ; බෝමසුවරී, බොහෝ ගණනක් මසු අගී; සිපි, සිප්පිකටු; මුතු, මුතුවලින්; ලකක්වත්, ලක්‍ෂයෙන් කොටසක් හෝ ස්වල්පයක්වත්; නොවටී, නොඅගී; එමෙන්, එපරිද්දෙන්ම; ලුහුදන, සුලුමිනිසුන්ගේ; පුත්, පුත්‍රයෝ; පෙර, පූර්‍වයෙහි; කළ, කරණලද; පිණෙන්, පුණ්‍යයෙන්; බබලත්, භ්‍රාජිතවෙති.

141 කම්මැලිහට, කර්‍මයෙහි අලසයාට; සිල්ප, ශාස්ත්‍ර; නොසිදුවේ, සිද්ධනොවේ (හෙවත්) නොසැදේ; එබැවින්, ඒ හෙතුවිසින්; නිදනවේ, (ඔහු)නිර්ධනීවෙයි; නිදනහට, වස්තුනැත්තාට; මිතුරු නැත්, මිත්‍රයෝ නොවෙති; එහෙයින්, ඒ හෙතුවිසින්; සිතට, චිත්තයට; සැපනැත්, සැපයක්නැත්තේය.

142 කිරි සමුදුර ඉඳත්-උවිඳු නොබොනුව ගණු නොමැති වත්,
මසුරුවූ දනන්වෙත-උනත් දෙලොවම ඇති වැඩෙක්නැති.

143 සිව්පා සතුන්ගේ-උවදුරු දුරැර කෙත රකිනමෙන්,
දසදම්නි පවතින-නිරිඳුන් වෙතින් සත දුක්නිවේ.

144 බාලරිවි වැදගිම-යමකුළෙන් අඳුරු දුරුවනමෙන්,
මැදහත් නිරිඳුන්ට-පැමිනි සතුරෝ බිඳී දුරුවෙත්.

145 දෙලෝ රකින නිරිඳෝ-සතට දුක්වන්ට ඉඩනොහරින්,
ලොව රකින මේරදූ-කලට වැසි වස්වන විලස්මෙන්.

146 වන දවන ගිනිකඳ-සිහිල් නල වසහව නිවෙනුමෙන්,
තද තෙදැති නිරිඳෝ-ගුණැති මැතිවර වදන පිහිටත්.

---

142 උවිඳු, විෂ්ණුතෙමේ; කිරිසමුදුර, ක්ෂීරසාගරයෙහි; ඉඳත්, හිඳිමිනුත්; නොබොනුව, පානයනොකරන්නේය; වත්, (යම්කිසි) වස්තුවක්; ගණුනොමැති, ගැණිමටනැත්තාවූ; මසුරුවූදනන්වෙත, මාත්සර්‍යජනයන්ලඟ; උනත්, වාසයකළත්; දෙලොවම, උභයලොකයෙහිම; ඇතිවැඩෙක්, ඇත්තාවූ වැඩෙක්නම්; නැති, නැත්තේය.

143 සිව්පාසතුන්ගේ, චතුස්පදික සත්ත්වයන්ගේ; උවදුරු, උපද්‍රවයන්; දුරැර, දුරුකොට; කෙත, ක්ෂෙත්‍රය; රකිනමෙන්, රක්ෂාකරන්නාසේ; දසදම්නි, දශරාජධර්මයෙන්; පවතින, ප්‍රවර්තිතවන්නාවූ; නිරිඳුන්වෙතින්, නරෙන්ද්‍රයන්කෙරෙන්; සත, සත්ත්වයන්ගේ; දුක්, දුඃඛය; නිවේ, සංසිඳේ.

144 යමකුළෙන්, යුගන්ධරපර්වතයෙන්; බාලරිවි, තරුණසූර්‍ය්‍යයාගේ; ගිමවැද, රශ්මිප්‍රවිෂ්ටව; අඳුරු, අන්ධකාරය; දුරුවනමෙන්, දුරුවන්නාසේ; මැදහත්, මධ්‍යස්ථවූ; නිරිඳුන්ට, නරෙන්ද්‍රයන්කරා; පැමිනි, සම්ප්‍රාප්තවූ; සතුරෝ, ශත්‍රැහු; බිඳී, භෙදව; දුරුවෙත්, දුරුවන්නෝය.

145 දෙලෝ, උභයලෝකය; රකින, රක්ෂාකරන්නාවූ; නිරිඳෝ, නරෙන්ද්‍රයෝතුමූ; සතට, ලොකසත්ත්වයාට; දුක්වන්ට, දුක්විමට; ඉඩනොහරින්, අවකාශ නොතබත්; ලොව, ලොකය; රකින, රක්ෂාකරන්නාවූ; මේරදූ, මෙඝරාජයා; කලට, සුදුසුකාලයට; වැසි, වර්ෂාව; වස්වනවිලස්මෙන්, වස්වනවිලාසය මෙනි.

146 වනදවන, බැදි දවන්නාවූ; ගිනිකඳ, වහ්නිස්කන්ධය; සිහිල්නල, ශීතලපවනට; වසහව, වසඟවී (යටවත්) අසුව්; නිවෙනුමෙන්, නිවෙන්නාසේ: තදතෙදැති, ඝනබද්ධතෙජස්ඇත්තාවූ, නිරිඳෝ, නරෙන්ද්‍රයෝතුමූ; ගුණැති, ගුණඇත්තාවූ; මැතිවර, මන්ත්‍රීවරයන්ගේ; වදන, වචනයෙහි; පිහිටත්, ප්‍රතිෂ්ඨිතවන්නෝය.

147 සිනෙත් ගැලවෙන්ට–නොපිලිවනි කොතැනක සැඟවුනත්,
එමෙන් නිරිඳුන්හට-වරදකළවුන් වදින තැන්නැත්.

148 තමහිමිහට දුකක්–පැමිනි විට නොහැර ගතහොත් දුක්,
මෙලොව යස සිරිවේ–පරලෙව්හි සුරසැපත් අත්වේ.

149 නිරිඳුන්ට දෙලෝ වැඩ–සිදුවේ නුවණැති ඇමතියන්ගෙන්,
මහ,ඔසු පඬිනැණින්–රදුටවූ වැඩ අසව් දහමින්.

150 මෙබඳු බෝසත්ගුණ–යුත් කෙළෙහි ගුණදත් රජුන්හා,
සතුරෝ මිතුරුවෙත්–ඔවුන් වග පිළිවෙළින් පවතිත්.

151 නුවණැති මැතිවරන්–කීමෙහි යෙදෙනු රජුට නියමයි,
සිතැතිකම් සිදුවේ–සත්කොන් වැවේ කුළුණු වැස්සෙන්.

---

147 කොතැනක, කොයිස්ථානයක; සැඟවුනත්, සැඟවීඋන්නමුත්; සිනෙත්, ස්වප්නයෙන්; ගැලවෙන්ට, නිදහස්වන්ට; නොපිලිවනි, නුපුලුවන්වෙයි; එමෙන්, එලෙසින්ම; නිරිඳුන්හට, නරේන්ද්‍රයන්ට; වරද, වද්‍යය; කළවුන්, කළාවූඅයට; වදිනතැන්නැත්, ප්‍රවිෂ්ටවන ස්ථානනැති.

148 තම, තමන්ගේ (නොහොත්) තමන් ආශ්‍රයකරණ; හිමිහට, ස්වාමියාට, දුකක්, දුඃඛයක්; පැමිනිවිට, සම්ප්‍රාප්තකල්හි; නොහැර, පහනොකොට; දුක්ගතහොත්, දුක්ගත්තේනම්; මෙලොව, මේලොකයෙහි; යසසිරිවේ, යසඓශ්වර්‍ය්‍යවන්නේය; පරලෙව්හි, පරලොවදී; සුරසැපත්, දිවසැපත්; අත්වේ, හස්තප්‍රාප්තවේ.

149 නුවණැති, ප්‍රඥාවන්තවූ; ඇමතියන්ගෙන්, අමාත්‍යයන් කරණකොටගෙන; නිරිඳුන්ට, නරේන්ද්‍රයන්ට; දෙලෝවැඩ, උභයලොකාර්ථය; සිදුවේ, සිද්ධවේ; මහඔසුපඬි, මහෞෂධපණ්ඩිතයන්ගේ; නැණින්, ඥානයෙන්; රදුට, (වෙදෙහ) රජහට; වූවැඩ, වූනාවූඅර්ථයන්; දහමින්, ධර්මයෙන්; අසව්, ශ්‍රවණය කරව්.

150 මෙබඳු, මෙයාකාරයෙන්; බෝසත්, බොධිසත්වයන්ගේ; ගුණයුත්, ගුණයෙන්යුක්තවූ;(නොහොත්)බෝසත්ගුණයුත්, බොහෝ සත්පුරුෂගුණයෙන් යුක්තවූ; කෙළෙහිගුණදත්, කෘතොපකාර දත්තාවූ; රජුන්හා, රජවරුන්හා; සතුරෝ, ශත්‍රුහු; මිතුරුවෙත්, මිත්‍රවන්නෝය; ඔවුන්වග, ඔවුන්ගේ වර්ගය; පිළිවෙළින්, පටිපාටියෙන්; පවතිත්, ප්‍රවර්තිතවෙත්.

151 නුවණැති, ප්‍රඥාවන්තවූ; මැතිවරන්, මන්ත්‍රීවරයන්ගේ; කීමෙහි, (අවවාද) කතායෙහි; යෙදෙනු, යෙදීම; රජුට, රජහට; නියමයි, නියතය; සිතැතිකම්, (ඒ යෙදීමෙන්) සිත්හි ඇතිකාම; සිදුවේ, සිද්ධවේ; කුළුණු, (රජහුගේ) කරුණානැමති; වැස්සෙන්, වර්ෂාවෙන්; සත්කොන්, සස්‍ය නැමති ක්ෂෙත්‍රය; වැවේ, වර්ධනවේ.

152 ලොව රකින නිරිඳුන්-කිපුන පව්කළ දනෝ වැනසෙත්,
සත්කෙත් වවනමේ-නොමද වැස්සෙන් නසන විලසින්.

153 පරහට නොදී දුක්-දුදනන් වෙතට නොගොස් දූහැමින්,
දවස් පසුවේ නම්-මහත් ඉසුරකි වැඩි වියත්හට.

154 පසිඳු පිරිසිඳුකුලෙ-මුත් මැද දුදනයෙක් පැමිනියොත්,
පිරිහියේ සෙදින්-අමාවිසඳුන් නසින විලසින්.

155 මහ පොළොවට වඩා-මහත් වත්නැති මෙමුලුලොවෙහි,
ඊටත් මහත්වේ-තමා ඉසුරුව් වරද ඉවසුම්.

156 බබලන මහමෙරත්-කුල පව්වලින් තෙවුන විලසින්,
ලොවැති නිරිඳුන්ටත්-ඇමතිවරු ඇතිහොතින් හොබනේ.

157 දිවාරෑ බබලන-රිවිසඳුසෙ පෙනෙන දෙවියෝ නැති,
මෙබඳු දෙවියන්ටත්-අතරතුර රාහුගෙන් බියවේ.

---

152 ලොව, ලෝකය; රකින, රක්ෂාකරන්නාවූ; නිරිඳුන්, නරේන්ද්‍රයන්; කිපුන, කොපවීනම්; පව්කල, පව්කලාවූ, දනෝ, ජනයෝ; වැනසෙත්, විනාශවෙත්; සත්, මනාවූ; කෙත්, ක්ෂෙත්‍රයන්; වවන, වර්ධනකරන්නාවූ; මේ, මෙඝයතෙමේ; නොමද, බොහෝකොට; වැස්සෙන්, වර්ෂාකිරීමෙන්; නසනවිලසින්, (එම ක්ෂෙත්‍ර) විනාශකරන්නාමෙනි.

153 පරහට, අන්‍යයන්ට; දුක්නොදී, දුඃඛදානයනොකොට; දුදනන්, දුර්ජනයන්ගේ; වෙතට, සමීපයටහෝ පක්ෂයට, නොගොස්, නොපැමින; දූහැමින්, ධර්මයෙන්; දවස්, දිනයන්; පසුවේනම්, ගතවන්නේනම්; වියත්හට, ව්‍යක්තයන්ට; වැඩි, අධිකවූ; මහත්ඉසුරකි, මහාඓශ්වර්යයකි.

154 පසිඳු, ප්‍රසිද්ධවූ; පිරිසිඳු, පරිශුද්ධවූ; කුලෙවුන්, වංශයෙහි හෝ කුටුම්බයෙහිනමුත්; මැද, මධ්‍යයෙහි; දුදනයෙක්, දුර්ජනයෙක්; පැමිනියොත්, සම්ප්‍රාප්තවූවහොත්; සෙදින්, ශීඝ්‍රව; පිරිහියේ, පරිහානියපැමිනේ; විසඳුන්අමා, විෂයෙද්‍ර අමෘතය; නසිනවිලසින්, නසිනවිලාසයමෙනි.

155 මෙමුලුලොවෙහි, මේ සියලුලොකයෙහි; මහපොළොවටවඩා, මහාපෘථිවියට වඩනා; මහත්වත්, මහත්වූ වස්තුවෙක්; නැති, නැත්තේය; තමාඉසුරුව, තමන්අධිපතිව; වරදඉවසුම්, (අන්‍යයන්ගේ) වරදඉවසීම; ඊටත්මහත්වේ, ඒ මහාපෘථිවියටත් වඩා මහති.

156 බබලන, භ්‍රාජිතවන්නාවූ; මහමෙරත්, මහාමෙරුපර්වතයත්; කුලපව්වලින්, සප්තකූටපර්වතයන්ගෙන්; තෙවුනවිලසින්, බබලනපරිද්දෙන්; ලොවැති, ලොකයෙහිඇත්තාවූ; නිරිඳුන්ටත්, නරේන්ද්‍රයන්ටත්; ඇමතිවරු, අමාත්‍යවරයෝ; ඇති හොතින්, ඇතිවෙත් නම්; හොබනේ, බබලා.

157 දිවාරෑ, දිවාරාත්‍රියෙහි; බබලන, බබලන්නාවූ; පෙනෙන, දෘශ්‍යමානවන්නාවූ; රිවිසඳුසෙ, හිරසඳවැනි; දෙවියෝ, දෙවිහු, නැති,(මෙ

158 පව්බැඳි සිත්නොමැති-දනහට යම්දෙසක් පැමුනුනත්,
වතනොවැකි අත්ලෙහි-විස නොනැගෙණ මෙන් නොවේ දුක්.

159 නලසිලු තුලටවැද-සිසිලනල නොනැසි පවනිත එව්,
සමත් නැණ මැතිවරු-රදුන්වෙත නිති වැදත් නොනැසෙත්.

160 නිරිඳුන්ගෙ සිතඉඟි-නොදත් මැතිවර නොදත් ගිජිඤෙ,
තෙසක් සිවුපායුත්-මැති ඇති රජුට සිතුව සැදේ.

161 නිරිඳුන් ඉදිරියෙහි-අකාරණකන්කෙඳිරි නොකරව්,
රද අදහස් ලෙසට-වදන් දෙව්දෙව් සැබැවනමෙන්.

---

න) නැත්හ; මෙබඳු, මෙසාකාරවූ; දෙවියන්ටත්, දෙවයන්ටත්; අන රතුර, අනන්තරනතරයෙහි; රාහුගෙන්, රාහුනම්තැනැත්තාගෙන්; බියවේ, භයවන්නේය.

158 පව්බැඳි, පාපයෙන්බඩවූ; සිත්, චිත්තය; නොමැති, නැත්තාවූ; දනහට, ජනයාට; යම්දෙසක්, යම්දෝෂයක් හෝ සුලුපාපයක්; පැමුනුනත්, සම්ප්‍රාප්තවුවත්; වත, වකත්‍රයෙහි; නොවැකි, නොලගනව හෝ නොගැව්; අත්ලෙහි, හස්තතලයෙහි; විස, විසතෙමේ; නොනැගෙණමෙන්, උදගතනොවන්නාසේ; දුක්නොවේ, දුක් හටනොගන්නේය.

159 සිසිලනල, ශීතලවූපවන; නලසිලුතුළට, වහනිශිඛාභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටව; නොනැසි, විනාශනොව; පවත්නඑව්, පවතින්නාසේ; සමත්, දක්‍ෂවූ; නැණ, ඥානවන්තවූ; මැතිවරු, මන්ත්‍රිවරයෝ; නිති, නිරන්තරයෙන්; රදුන්වෙත, රජුන්ගේසමීපයට; වැදත්, ප්‍රවිෂ්ටවත්; නොනැසෙත්, විනාශනොවෙත්.

160 නිරිඳුන්ගේ, නරෙන්ද්‍රයන්ගේ; සිත, චිත්තය සම්බන්ධවූ; ඉඟි, අදහස; නොදත්, නොමදත්තාවූ; මැතිවර, අමාත්‍යවරයෝ; නොදත්, දලනැත්තාවූ; ගිජිඤෙ, හස්තීහුය; * තෙසක්, ත්‍රිවිධශක්තිසහා; † සිවුපායුත්, චතුරොපායයෙන්යුක්තවූ; මැතිඇති, මන්ත්‍රීන්ඇත්තාවූ; රජුට, රජහට; සිතුව, සිතුදේ; සැදේ, සිඩවේ.

161 නිරිඳුන්, නරෙන්ද්‍රයන්ගේ; ඉදිරියෙහි, අභිමුඛයෙහි; අකාරණ, නොකරුණෙහි; කන්කෙඳිරි, කර්ණටකෙඳිරීම; නොකරව්, නොමකරව්; රද, රජහුගේ; අදහස්ලෙසට, අධ්‍යාසයවූනියාවට; සැබැවනමෙන්, සත්‍යවනපරිද්දෙන්; දෙව්වදන්, සුඩවචන; දෙව්, දනයකරව්.

---

* පභාවු'ස්සාහ මන්තානං-වසා තිස්සොහි සත්තියො-

† භෙදෙ දණ්ඩො සාමදානානුපායා චතුරො ඉමෙ-

162 ලොව නැව දනා බඩු-නැව්නා නිරිඳු මෙඇම සමගින්,
ව්‍යත් මැති මාලිම්-උගත් සත්බෙලෙනි පවතිනුයේ.

163 කිසිකාරිය නැතත්-රදුන් හා මැතිවරන් නිතියෙන්,
සෙව්නා දනන්ගේ-දනට රැකවරණයෙකි සුරකින්.

164 රදුන් සෙව්නා දන-නොලං නුදුරුව ගිනි තපින මෙන්,
සිහි නුවණින් සෙදී-සප් රදෙකුමෙන් සිතා වැජඹෙව්.

165 රජුන් උදහස්වුව-පෙරටුව අතුරු වදන් දෙන්නෝ,
ගිනිලඟ ඉටිසිරෙණ-ලෙසින් තම සිරිනි පිරිහීයෙත්.

166 රදුන් තිලිනෙන් මුත්-අන් සතෙකුගෙන් නොයේ දුක්ගිම්,
වැසිවැසම්ස ගිමන-යේද පිනි බටුවයි සතුන්ගේ.

---

162 දනා, ජනයන්නැමති; බඩු, භාණ්ඩයන්ද; නිරිඳු, නරේන්ද්‍ර නැමති; නැව්නා, නෞකානායකයාද (යන); මේඇමසමගින්, මෙකී සියල්ලහා; ලොවනැව, ලොකනැමති නෞකාව; පවතිනුයේ, ප්‍රවත්තීනයවන්නේ; ව්‍යත්, ව්‍යක්තවූ; මැතිමාලිම්, අමාත්‍යනැමති නියමුනායකයා; උගත්, උද්ග්‍රහණයකළාවූ; සත්බෙලෙනි, ශාස්ත්‍රබලයෙනි.

163 කිසිකාරියනැතත්, (අනික්) කිසිකටයුත්තක් නැත්තමුත්; නිතියෙන්, නිරන්තරයෙන්; රදුන්හා මැතිවරන්, රාජ රාජමහාමාත්‍යයන්; සෙව්නා, සෙවනයකරන්නාවූ; දනන්ගේ, ජනයන්ගේ; (ඒ සෙවනය) දනට, වස්තුවට; සුරකින්, යහපත්ව රක්ෂාකරන්නාවූ; රැකවරණයෙකි, රක්ෂාවරණයෙකි.

164 රදුන්සෙව්නාදන්, රාජසෙවයකරණ ජනයෙනි; නොලංනුදුරුව, නොළඟව නුදුරුව; ගිනිතපිනමෙන්, වහ්නිතාපනයකරන්නාසේ; සිහිනුවණින්, ස්මෘතිප්‍රඥයෙන්; සෙදී, යුක්තව; සප්රදෙකුමෙන්, සර්පරාජයෙක්සේ; සිතා, චින්තනයකොට; වැජඹෙව්, විජෘම්භිතවෙව්.

165 රජුන්, රජවරුන්ගේ; උදහස්, කොපය; වුව, වුවහොත්: පෙරටුව, ඉදිරියෙහි (ඉඳ); අතුරුවදන්, අන්තරතුරවචන; දෙන්නෝ, දානයකරන්නෝ; ගිනිලඟ, වහ්නිය සමීපයෙහි; ඉටි, සික්ථය; ඉසිරෙණලෙසින්, උනුව විලීන්වන්නාසේ; තමසිරිනි, තමන්ගේ සම්පත්තියෙන්; පිරිහීයෙත්, පරිහානියට පැමිනෙත්.

166 රදුන්, රජවරුන්ගේ; තිලිනෙන්මුත්, තෘෂ්ණයෙන්විනා; අන්සතෙකුගෙන්, අන්‍යසත්වයෙකුගෙන්; දුක්ගිම්, (ලොකයාගේ)දුඃඛනැමති ග්‍රීෂ්මය; නොයේ, පහනොවේ; වැසිවැසම්ස, වර්ෂාවවැසීමෙන් විනා; සතුන්ගේ, සත්වයන්ගේ; ගිමන, ග්‍රීෂ්මය; පිනිබටුවයි, හිමිබැවයිකියා; යේද, පහවන්නේද.

167 රජුන් ලොබැති දෙයට–ලොබ නොකරව් පණව සිතැතොත්,
පළහැටි ගොදුරුලොබින්-වැටුපුමැද වැද නැසෙන ලෙසවේ.

168 රන්බදුනැසුරුකල–කදවත් නමුත් ලොවෙහි බබලත්,
රන්මෙර ඇසුරුකල–හැමසතුන් එම රුවය වනුමෙන්.

169 නිරිඳු කිපුනෙතැනින්-පහව ගැලවෙති නැණැති සුදියෝ,
එනසැර පහරදුක–ඉවත පැන ගැලවුනෝ සමති.

170 රදු අදින බිඳිනා–සැරහෙන බුදින ඉඳිනා,
රජසිරිතිනෙකකුත්–නොකරව් සිතැත ඉදිනා.

171 රදුන් සිතැතුළකම්–නොදැන නොමදව වදන් දෙන්නෝ,
නොහඳින සිව්සැටක්-බරණ ලා විල් කෙළිනවුන් වැනි.

---

167 රදුන්ලොබ, රජුන්ගේලොභය; ඇතිදෙයට, ඇත්තාවූවස්තු වටහෝද්‍රව්‍යයට; පණව සිතැතොත්, ප්‍රාණයට ආලයඇත්තේනම්; ලොබනොකරව්, ලොභයනූපදවව්; පළහැටි, පතඞගතෙමේ; ගොදුරු ලොබින්, ගොචරලොභයෙන්; වැටුපු මැද, ප්‍රදීපමධ්‍යයට; වැද, ප්‍රවි ෂ්ටව; නැසෙනලෙස, විනාශවන ආකාරය; වේ; වන්නේය.

168 රන්බදුන, ස්වර්ණභාජනය; ඇසුරුකළ, ආශ්‍රයකළාවූ; කද වත්නමුත්, කදමැටිවුවත්; ලොවෙහි, ලොකයෙහි; බබලත්, බබලති; රන්මෙර, ස්වර්ණමෙරුව; * ඇසුරුකල, ආශ්‍රයකළාවූ; හැමසතුන්, සියලුසත්වයන්; එමරුවයවනුමෙන්,එම රන් වර්ණය වන්නාමෙනි.

169 නිරිඳු, නරෙන්ද්‍රයා; කිපුන, කොපවූව; එතැනින්, ඒ ස්ථාන යෙන්;පහව, ඉවත්ව; නැණැති, ඥනවන්නාවූ; සුදියෝ, හුදීජනයෝ; ගැලවෙති, නිදහස්වෙත්; එන, (තමන්කරා) එන්නාවූ; සැරපහර, ශර ප්‍රහාරය; දුක, දශීනයවී; ඉවතපැන, අහකපැනලා; ගැලවුනෝ, නිදහස්වූවෝ; සමති, දක්‍ෂයි.

170 රදු,රජහුගේ; අඳින, ආච්ඡාදනය කරන්නාවූද; බඳිනා, බන්ධ නය කරන්නාවූද;සැරහෙනඃඅලංකාරවන්නාවූද;බුදින, අනුභව කා රන්නාවූද; ඉදිනා, නිසද්‍ය කරන්නාවූද; (හෙවත්) ඉන්නාවූද(යනා මේ); රජසිරිතින්, රාජචාරිත්‍රයෙන්; එකකුත්, එකක්නමුත්; ඉදිනා, ජිවිතයෙහි; සිතැත, චිත්තය ඇත්තේනම්; නොකරව්, නොමකරව්.

171 රදුන්, රජුන්ගේ; සිතැතුළ, චිත්තාභ්‍යන්තරයෙහි; කම්, අද හස්කටයුතු;නොදැන, ජානනය නොකොට; නොමදව, බොහෝකො ට; වදන්, වචන; දෙන්නෝ, දානයකරන්නෝ(හෙවත්) කියන්නෝ; නොහඳිනා, (තටාකක්‍රීඩාපිණිස) නොහඳින්නාවූ; සිව්සැටක්අබරණ,

---

* "නෙරුරිව අවිසෙසකරා"යි දෙසනා–හිමවත රන්වන් රස් වි ෂ්රණ "නෙරු"නම් පව්වක්ඇති·එහි හුන් හංසමයූරාදි සියලු ලිහිණි යක් තමාපැහැයෙන් එක්රන්වන්ම කෙරෙයි–මේ මහමෙරනොවේ.

172 තෙද විකුම් ගුණනැණ-ඉසුරුමත් රජුට නැති සතුරෝ,
තුබම්ණ උදුවිට-අඳුරු දිව අන්දිවට වන් මෙනි.

173 සැබැබස දෙවියන්-වෙත පවතියි බොරු දනන් තුඩවේ,
එහෙයින් දනන්ගෙන්-නිබොරු සත ලොව සුරන්සුරුවෙන්.

174 නිවන් සත් වුවත්-සත්පුතෙකු ලදහොත් පින්වත්,
නොමද සව් සිරිවේ-සිතුමිණක් ලත්කලක් විලසින්.

175 බත් පැසෙන තෙක්මුත්-නොමද ගිනිකල බතින් වැඩනැති,
ඒ මෙන් දසුන් කළ-වරද පමණට මුත් නොවව් තද.

176 කුලනැණගුණඇතත්-නොතකත්ලොවෙහි තෙදැතියන්මෙන්,
සඳ වසැ වරෙක වැඳ-වඳිත් නිති රිවි පුදෙන් සැරසී.

---

හැටහතරක්පමණ ආභරණයන්; ලා, බහාගෙණ; විල්, තටාකයෙහි; කෙළිනවුන් වැනි, ක්‍රීඩාකරන්නන් සමානයි.

172 තෙද, තේජසද; විකුම්, වික්‍රමද; ගුණනැණ, ගුණ හා ඥානයද ඇති; ඉසුරුමත්, ඓශ්වර්‍ය්‍යවත්වූ; රජුට, රජහට; සතුරෝ, ශත්‍රුහු; නැති. නැත්තෝය; තුබම්ණ, සූර්‍ය්‍යයා; උදුවිට, උද්ගතකල්හි; අඳුරු, අන්ධකාරය; දිව, ධාවනයකොට; අන්දිවට, අන්‍යද්වීපයට; වන්මෙනි, ප්‍රවිෂ්ටවූවා සමයි.

173 සැබැබස, සත්‍යවචනය; දෙවියන්වෙත, දෙවියන්කෙරෙහි හෝ සමීපයෙහි; පවතියි, වැටෙයි; බොරු, මුසාවාද; දනන්, මනුෂ්‍ය සඞ්ඛ්‍යාත ජනයාගේ; තුඩවේ, මුඛයෙහිවේ; එහෙයින්, ඒ හෙතුවිසින්, දනන්ගෙන්, ජනයාකෙරෙන්; නිබොරුසත, නොබොරුසත්වයෝ (හෙවත්) බොරුනොකියන මිනිස්සු; ලොව, (මේ) ලොකයෙහි සුරන් අයුරු වෙත්, දෙවියන් සමාන වෙති.

174 නිවන්, නිර්ධනීවූ; සත්වුවත්, සත්වයෝ නමුත්; පින්වත්, පුණ්‍යවන්තවූ; සත්, සත්පුරුෂවූ; පුතෙකු, පුත්‍රයෙක්; ලදහොත්, ලැබුයේ නම්; සිතුමිණක්, චින්තාමාණික්‍යයක්; ලත්කලක් විලසින්, ලදකලක් පරිද්දෙන්; නොමද, බොහෝවූ; සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යය; වේ, ඇතිවන්නේය.

175 බත්, භක්තය; පැසෙනතෙක්මුත්, පචනයවන කල දක්වා විනා (ඉන්වැඩියක්); නොමද, බොහෝකොට; ගිනිකල, ගිනිකෙළේ නම්; බතින්, භක්තයෙන්; වැඩනැති, අර්ථයක්නැත්තේය; ඒ මෙන්, එපරිද්දෙන්ම; දසුන්, දුශයන් විසින්; කළ, කරණලද්දවූ; වරද පමණටමුත්, වද්‍යයෙහි ප්‍රමාණයටවිනා; තද, සාබාධය (හෙවත්) තද බැව්; නොවව්, නොමවෙව්.

176 කුල, වංශයද; ගුණනැණ, ගුණහාඥානයද; ඇතත්, ඇත්නමුත්; ලොවෙහි, ලොකයෙහි; තෙදැතියන්මෙන්, තෙජස්ඇත්තන් සේ; නොතකත්, තක්‍ෂණය නොකරත්(හෙවත්) නොසලකත්; සඳ, චන්ද්‍රයා; වසැ, වර්‍ෂයෙහි; වරෙක, එක්වරක්; වැඳ, වන්දනාකොට; නිති; නිතර; සැරසී, සැරසීගෙණ; පුදෙන්, පූජාකිරීමෙන්; රිවි, සූර්‍ය්‍යයා; වඳිත්, නමස්කාර කරති.

177 පව්කළවුන්ගෙ පණ–නොනැසැ ඇවිදී බවක් පාසා,
පින්කළ සතන්පණ–මොක්දූක නිවේ කපුරුපහනෙව්.

178 පරපණ නසනුහට–නොදූනේය මදකුත් පවෙහි තද,
මළකඳට ගත්ගිනි–කඳ තදූයි නොදූනෙන විලස්මැයි.

179 බෙරහඬ යොදුනකට–ඇසේ සෙනහඬ දෙලොස්යොදුනෙක,
දන්දෙන තුමන්ගේ–දනසද ඇසේ සියල් තිලොවට.

180 සව් කුසුමෙහි සුවඳ–නලඅනුවමුත් නොයේ පෙරටුව,
සතගේ සිල් සුවඳ–දසදෙසම පවතියි නිරතුරෙන්.

---

177 පව්කළවුන්ගේ, පව්කළාවූ සත්ත්වයන්ගේ; පණ, ප්‍රාණයතෙම; නොනැසැ, විනාශනොව; බවක්පාසා, ජාතිජාතියෙහි; ඇවිදී, සැරිසරයි; පින්කළ, පුණ්‍යකර්මකළාවූ; සතන්පණ, සත්ත්වයන්ගේ ප්‍රාණය; මොක්දූක, නිර්වාණදර්ශනයෙන්; කපුරුපහනෙව්, කර්පූර ප්‍රදීපයක් සේ; නිවේ, සංසිඳේ. *

178 පරපණ නසනුහට, පරප්‍රාණ විනාශකරන්නාට (හෙවත්) ප්‍රාණඝාතකරන්නාට; පවෙහි, පාපයෙහි; තද, දෘඪබව; මදකුත්, ස්වල්පයකුදු; නොදූනේය, නොහැඟෙයි; මළකඳ, මෘතශරීරයෙහි; අට ගත්ගිනිකඳ, ඇවිලුනු වහ්නිස්කන්ධය; තදූයි, දෘඪයයි; නොදූනෙන විලස්මැයි, නොමදූනෙන ආකාරමැයි.

179 බෙරහඬ, භෙරිශබ්දය; යොදුනකට, යොදුනක් ප්‍රමාණයට; ඇසේ, ශ්‍රවණයවේ; සෙනහඬ, අශනිශබ්දය; දෙලොස්යොදුනෙක, ද්වාදශයොජනයෙක්හි (ශ්‍රවණයවේ); දන්දෙන, දන්දෙන්නාවූ; උතුමන්ගේ, උත්තමයන්ගේ; දනසද, දානශබ්දය; සියල්, සියලුම; තිලොවට, ත්‍රිවිධලොකයට; ඇසේ, ශ්‍රවණයවේ.

180 සව්කුසුමෙහි, සකලපුෂ්පයෙහි; සුවඳ, සුගන්ධය; නලඅනුවමුත්, පවනානුගානව විනා; පෙරටුව, (පවන) ඉදිරිව; නොයේ, ගමන් නොකෙරේ; සතගේ, ශාන්තයාගේ; සිල්සුවඳ, ශීලසුගන්ධය; නිරතුරෙන්, නිරන්තරයෙන්; දසදෙසම, දශදිශායෙහිම; පවතියි, ප්‍රවර්තිතවේ (හෙවත්) ගමන්කෙරේ.

---

* යම් ජාතියක ලැබූ ජීවිත හෙතුවෙන් අනතුරු ජීවිතයක් නිපදවීමට හෙතුවූ කර්මය රැස්කරයි, එබඳුවූවන්ගේ ජීවිතහෙතුව නිරුද්ධ නොවී එකිනෙකට මතු මතු සම්බන්ධහෙයින් ප්‍රාණය නොනැසීම ඥනු මෙහි භාවයයි හැඟේ.

181 නුවණැති මැද හතුන්-නොපත් සබමැද පැමිනි සුදනෝ,
අඳුරු ගෙය තුළවැද-අන් තිබූ බඩු සොයනුවෝ වෙත්.

182 අමයුරු වදන්හැර-තද කුරිරු බස් දෙන දුදනයෝ,
විලිකුන් පලදමා-නිරස පලබුදින්නෝ යුරු වෙත්.

183 සුරාබොන දනහට-කොතෙක් කීවත් බස් නොහසත්,
මදුතුට සන්කලත්-තමා යන අතකටම යනමෙනි.

184 සුරාබී නොහඟවා-සබමැද ගොස් උනත් කරබා,
මුව විසිරි නොමොම-කතා කරවා සතට අඟවා.

185 පරපණ නසා පණ-රකින පිවිටු දුදනෝ අවියත්,
ලෙවියා වැනි දිවින්-විසය අත වක වකා කා මී.

---

181 නුවණැති, ප්‍රඥාවඇත්තාවූ; මැදහතුන්, අපක්ෂවාදීන්; නොපත්, අසම්ප්‍රාප්තවූ; සබමැද, සභාමධ්‍යයට; පැමිනි, සම්ප්‍රාප්තවූ; සුදනෝ, හුදීජනයෝ; අඳුරුගෙයතුළ, අන්ධකාරගෘහාභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටව; අන්තිබූ, අන්‍යයෙකුවිසින් තබනලද්දවූ; බඩු, භාණ්ඩයන්; සොයනුවෝවෙත්, සොයන්නෝ සමාන වෙති.

182 අමයුරු, අමාවැනිවූ; වදන්, වචනයන්; හැර, පහකොට; තදකුරිරුබස්, දැඩික්‍රෑරවචන; දෙන, දානයකරන්නාවූ (හෙවත්) කියන්නාවූ; දුදනයෝ, දුර්ජනයෝ; විලිකුන්, මොනවට පැසුනාවූ; පල, ඵලයන්; දමා, පහකොට; නිරස, රසනැත්තාවූ; පල, ගෙඩි; බුදින්නෝ, අනුභවකරන්නාහු; අයුරුවෙත්, සමානවන්නෝය.

183 සුරා, රහමෙර; බොන, පානයකරන්නාවූ; දනහට, ජනයාට; කොතෙක්කීවත්, කොපමණකියේනමුත්; බස්, වචනයන්; නොහසත්, නොපිළිගණිත්; මදුතුට, මත්තාහසතියාට; සන්කලත්, සංඥාකලේනමුත්; තමායනඅතකටම, තමාගමනය කරණ දිශාවකටම; යනමෙනි, ගමන්කරන්නාමෙනි.

184 නොහඟවා, නොදන්වා; සුරාබී, රහමෙර පානයකොට; සබමැදගොස්, සභාමධ්‍යයට එලඹ; කරබාඋනත්, ගෙලනැළා උන් නමුත්; මුව, මුඛයෙහි; විසිරි, විශීර්ණවූ (හෙවත්) දතලාවූ; නොමොම, ඒ සුරානොමෝම; කතාකරවා, කතාකියවා; සතට, සත්වයාට; අඟවා, දන්වා.

185 පරපණ, අන්‍යයන්ගේ ප්‍රාණය; නසා, විනාශකොට; පණරකින, (සවීය) ප්‍රාණය රක්ෂාකරන්නාවූ; අවියත්, අව්‍යක්තවූ; පිවිටු, පාපිෂ්ඨවූ; දුදනෝ, දුර්ජනයෝ; විසය, විෂවර්ගය; කා, අනුභවකොට; අතවකවකා, හසනය ගගා; මී, මධුව; දිවින්, ජිහ්වාසෙන්; ලෙවියා වැනි, ලෙහ කළාක් සමානයි.

186 සිරුර උසුලානේක-තැන ඇවිද පරපණ නසනලෙස්,
උතුරුකුරු දිවයින-යකුන් නරවාහන කළාමෙනි.

187 සුරා පුරා බිබී-පරලෙව්හි විඳින නොමදදුක්,
තිබෙදී මෙලොවම-විඳිති දුක් පෙරනිමිති පානෙව්.

188 උගතත් මුනිදහම්-පව්ටුන්ගෙ සිත් මදකුත් නොඇලේ,
සිඳුමස් ලුණබු බී-එහිම වැස ගත ලුණු නොපත්මෙන්.

189 විරිදුන් මුල්සිඳිනු-නිරිදුට තබා බැරි සුරන්වත්,
නුබමිණ සතරදිප-දිවත් තමරුපු ගත නුහුනුමෙනි.

190 සව්බරණින් සැදී-මැතිසෙන් මැදෙහි උන් රජුන්ගේ,
බැබලීමටත් වැඩි-සෙන් සහ යුදට පත් නිරිඳුන්ගේ.

---

186 සිරුර,(සවිය)ශරීරය; උසුලා,උච්ඡනයකරමින්; නෙකතැන, නොයෙක්තන්හි; ඇවිද, ආහිණ්ඩනයකොට; පරපණ,අන්‍යප්‍රාණය; නසනලෙස්, විනාශකරණ ආකාරය; උතුරුකුරුදිවයින, උත්තරකුරුනම්දිවයිනෙහි; යකුන්, යක්ෂයන්විසින්; නරවාහන, මනුෂ්‍යවාහනයන්; කළාමෙනි, කරණලද්ද සමානයි.

187 සුරා, රහමෙර; බිබී, පානයකරකර; පුරා, සම්පූර්ණයෙන්; පරලෙව්හි, පරලොවදී; විඳින, විඳින්නාවූ; නොමද, අමන්‍දවූ; දුක්, දුඃඛය; තිබෙදී, තිබියදී; මෙලොවම, මෙලොකයෙහිම; පෙරනිමිතිපානෙව්, පූර්වනිමිතිප්‍රකාශකරන්නාසේ; දුක්විඳිති, දුඃඛවෙදනය කරති.

188 මුනිදහම්, බුඬධර්මය; උගතත්, උගත්නමුත්; පව්ටුන්ගෙ, පාපිෂ්ඨයන්ගේ; සිත්, චිත්තය; මදකුත්, සවල්පයකුත්; නොඇලේ, (ඒ ධර්මයපිළිපැදීමපිණිස) ආලයනොවේ; සිඳුමස්, සමුද්‍රමත්ස්‍යයෝ; ලුණබුබී, ලවණජලයපානයකොට; එහිමවැස, ඒ මුහුදෙහිම වාසය කොටත්; ගත, (ඒමත්ස්‍යයන්ගේ)ශරීරයෙහි; ලුණු, ලවණය; නොපත්මෙන්, නොපැමිනියාමෙනි.

189 විරිදුන්, වෛරීන්; මුල්සිඳිනු, මූලොච්ඡින්නකිරීම; නිරිඳුටතබා, නරෙන්‍ද්‍රයාට තබා;සුරන්වත්, දෙවියන්හටවුවත්; බැරි, බැරිරුම්ය (නොහොත්) නොහැකිය; නුබමිණ, හිරුතෙමේ; සතරදිප, සතරමහද්වීපයෙහි; දිවත්, ධාවනයකොටත්; තමරුපු, තමත්සතුරන් හෝ අන්ධකාරශත්‍රුන්; ගතනුහුනුමෙනි, ග්‍රහණයකළනොහැකිවූවාමෙනි.

190 සව්බරණින්, සකලාභරණයෙන්; සැදී, සජ්ජිතව; මැතිසෙන් මැදෙහි,මන්ත්‍රීන් සහිත සෙනාමධ්‍යයෙහි;උන්, උන්නාවූ;රජුන්ගේ, රාජයන්ගේ; බැබලීමටත්වැඩි, භ්‍රාජිතවීමටත් අධිකව; සෙන් සහ, සෙනාවහා; යුදටපත්, යුඬපිණිස ප්‍රවිෂ්ටවූ; නිරිඳුන්ගේ, නරෙන්‍ද්‍රයන්ගේ;(බැබලීම්වේ).

191 සත් රැකුමට පිහිට–අහරදිය ගිනිලුණුද වත්සව්,
මේහැම පිහිටමුත්–පිහිට මැදහත් රදුන්ගේ මැයි.

192 බැබලෙනසෙ රිවිසඳ–අඳුරු බැබලීමෙක් දියත නැති.
ලොව රකින නිරිඳුන්–ලෙසට අවසෙසු රජහු නොබබලත්.

193 පින්මදහට ඉසුරු–දුනත් ගත් දුක් සිතා නිරිඳුන්,
තෙල්මද පියල්ලෙන්–ගත් පහන නොපවතින ලෙසවේ.

194 නිරිඳුන්ගෙ මෙත්සිත්–සැබැවයි සිතා උඩගුවන්නෝ,
තිමදඇතුදල අග–මුතු ගණුව අතදිගුකරණ වැන්නෝ.

195 නිරිඳෝ තම රටට–මුත් අන් රටට දිවා සඳමෙනි,
පඬිවර අන්රටක–පැමිනියත් සුපුන්සඳසෙ බබලා.

---

191 සව්අහර, සියලු ආහාර වර්ගයෝද; දිය, ජලයද; ගිනි, වහ්නියද; ලුණුද, ලවණ හෝ කරුණාවද; වත්, (අවශෙෂ) වස්තුහෝ වස්ත්‍රද; සත්, සත්වයන්ගේ; රැකුමට, රක්‍ෂාවපිණිස; පිහිට, ප්‍රතිෂ්ඨායි; මේහැම, මේසියල්ලගේ; පිහිටමුත්, ප්‍රතිෂ්ඨා ඇත්තමුත්; පිහිට, ප්‍රතිෂ්ඨා නම්; මැදහත්, මධ්‍යස්ථවූ; රදුන්ගේමැයි, රාජයන්ගේ (පිහිට) මැයි.

192 රිවිසඳ, සූර්‍ය්‍යයාහා චන්ද්‍රයා; බැබලෙනසෙ, භ්‍රාජිතවන්නාසේ; අඳුරු, අන්ධකාරය; බැබලීමෙක්, භ්‍රාජිතවීමක්; දියත, ජගත්හි; නැති, නැත්තේය; ලොවරකින, ලොකයරක්‍ෂාකරන්නාවූ; නිරිඳුන්, නරෙන්ද්‍රයන්ගේ; ලෙසට, ආකාරයට; අවසෙසු, අවශෙෂවූ (ලොකයරක්‍ෂා නොකරන්නාවූ); රජහු, රාජයෝ; නොබබලත්, නොදිලිසෙති.

193 ගත්දුක්, ගත්තාවූදුඃඛයන්; සිතා, චින්තනයකොට; නිරිඳුන්, නරෙන්ද්‍රයන්විසින්; පින්මදහට, පින්අඩුසත්‍වයාට; ඉසුරු, ඓශ්චර්‍ය්‍යය; දුනත්, දෙනලද්දේනමුත්; තෙල්මද, තෛලමන්දවූ; පියල්ලෙන්, පහන්කබලින්; ගත්, ග්‍රහණයකළාවූ; පහන, ප්‍රදීපය; නොපවතිනලෙස, නොපවත්නාසේ; වේ, වන්නේය.

194 නිරිඳුන්ගේ, නරෙන්ද්‍රයන්ගේ; මෙත්සිත්, මෛත්‍රීචිත්තය; සැබැවයි, සත්‍යයයි; සිතා, චින්තනයකොට; උඩගුවන්නෝ, උද්ධතවන්නැනැත්තෝ; තිමදඇතු, ත්‍රිමද ගලිත හස්තියාගේ; දලඅග, දන්තාග්‍රයෙහි; මුතු, මුක්තාඵලයන්; ගණුව, ගන්නෙමිහයි; අත, හස්තය; දිගුකරණවැන්නෝ, දික්කරන්නන්වැනියහ.

195 නිරිඳෝ, නරෙන්ද්‍රයෝ; තමරටටමුත්, තමන්ගේරාෂ්ට්‍රයටමිස; අන්රටට, අන්‍යරාෂ්ට්‍රයට; දිවාසඳමෙනි, දහවල්චන්ද්‍රයාහාසමය; පඬිවර, පණ්ඩිතවරයෝ; අන්රටකපැමිනියත්, අන්‍යරාෂ්ට්‍රයකප්‍රවිෂ්ටවූවත්; සුපුන්සඳසෙ, සම්පූර්ණ චන්ද්‍රයා පරිද්දෙන්; බබලා, භ්‍රාජිතවෙත්.

196 සව්වත් දකින නෙත-තමා නොදකී කැඩපතින් මුත්,
නිරිඳුව නැණැති සත-මැතිඳු දපණින් දුටුසෙ සිදුවේ.

197 නිසාපිය වී නිසා-නිසා ගනඳුරු දුරුව යනමෙන්,
නිසා මැදහත්රදු-වෙතින් සතදුක් අඳුරු දුරුවේ.

198 නිරිඳුට ඔවාදෙන-ගුණනැණැති මැතිවර නැතහොත්,
අපමණ ඉසුරුනත්-නැතක් විරිඳුන් අවැඩ පැමිනේ.

199 නිරිඳුට දනව්ගම්-සව්සිරි ඇතොත් නැතත් බලසෙන්,
තරුපිරිවර නොමැති-නිසපිය නිසා පෙනෙන වැනිවේ.

200 නිරිඳුන්ගෙන්ඉසුරු-ලත්සත් නැසෙත් එම රදුන්ගෙන්,
දියෙන් ඉපදුන ලුණ-දියට පත් දියවන විලස්වේ.

---

196 සව්වත්, සියලුවසතුන්;දකිනනෙත, දක්නාසුලුවූ නෙත්‍රය තේම්; කැඩපතෙන්මුත්, ආදශයෙන්මිස; තමානොදකී, තමානොදක්නේය; නැණැතිසත, ඥානවන්තසත්වයන් (දකීම); මැතිඳුදපණින්, අමාත්‍යනැමති දපිණයෙන්; දුටුසේ, දුටුවාක්මෙන්; නිරිඳුට, නරේන්ද්‍රයාට; සිදුවේ, සිඬවේ.

197 නිසාපිය, චන්ද්‍රයාගේ; නිසාවී, ආශ්‍රයව; නිසා, රාත්‍රියෙහි; ගනඳුරු, ඝනාන්ධකාරය; දුරුවයනමෙන්, දුරුවීයන්නාසේ; මැදහත්රදු, මධ්‍යස්ථරජහුගේ;නිසා, ආශ්‍රයෙන්හෝ හෙතුවෙන්; සතවෙතින්, සත්වයන්කෙරෙන්· දුක්අඳුරු, දුඃඛාන්ධකාරය; දුරුවේ, පහවේ.

198 නිරිඳුට, නරේන්ද්‍රයාට; අපමණ, අප්‍රමාණවූ; ඉසුරු, ඓශ්වය්‍යීය; ඇතත්, ඇත්තේනමුත්; ඔවාදෙන, අවවාදදෙන්නාවූ; ගුණනැණැති, ගුණනුවණ ඇත්තාවූ; මැතිවර, මන්ත්‍රීවරයෝ; නැතහොත්, නැත්නම්; විරිඳුන්, වෛරීන්ගෙන්; නැතික්, අප්‍රමාණවූ; අවැඩ, අනභිවෘඩි; පැමිනේ, සම්ප්‍රාප්තවේ.

199 නිරිඳුට, නරේන්ද්‍රයාට; දනව්ගම්, ජනපදග්‍රාමයෝ; සව්සිරි, සකලෛශ්වය්‍යීය; ඇතත්, ඇත්නමුත්; බළසෙන්, භටසෙනාව; නැතොත්, නැත්නම්; තරුපිරිවර, තාරකාපරිවාර; නොමැති, නැත්තාවූ; නිසපිය, චන්ද්‍රයා; නිසා, රාත්‍රියෙහි; පෙනෙන්වැනිවේ, දෘශ්‍යමානවන්නාමෙනි.

200 නිරිඳුන්ගෙන්, නරේන්ද්‍රයන්ගෙන්; ඉසුරු, ඓශ්වය්‍යීය; ලත්සත්, ලැබූසත්වයෝ; එමරදුන්ගෙන්, එමරාජයන්ගෙන්ම; නැසෙත්, විනාශවෙති;දියෙන්, ජලයෙන්;ඉපදුන, උපන්නාවූ; ලුණ, ලවණය; දියට, ජලයට; පත්, පැමිනිකල; දියවනවිලස්, දියවන්නාසේ; වේ, වන්නේය.

201 මැදහත් රජඉසුරු–වැඩි වැඩිසෙ ලොවටත් වේය වැඩ,
සඳවැලඳිසාවා–දිනෙන් දින කැටුවම වැඩෙන මෙනි.

202 පින්පව් කළ සතන්–දිවසින් දුටුසෙ දකිත් නිරිඳෙ,
වැඩ අවැඩ දෙකටම–උන්උන්ම පමුනුවත් සැණෙකින්:

203 නිරිඳුන්ට පිරිදුවු–දනන් හා දවසරිණ අවියත්,
මරහට තමකරා–අත්සන්කොට කැඳවන විලස් වේ:

204 බෝකල් පුරුදුයයි–සිතාමදකුත් අලස නොසිතව්,
කිරි දී ඇතිකළත්–උරග ඇතිවිස නොවේ වෙනසක්.

205 සිල්ප උපදෙස්බස්–අබය මෙසතර දෙනඋතුමෝ,
පිය තමගෙ පියවූ–සමග පස්දෙන ම පිය පියවෙත්.

---

201 මැදහත්රජ, මධ්‍යස්ථරජහුගේ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; වැඩිවැඩිසෙ, වැඩෙන වැඩෙන් පරිද්දෙන්; ලොවටත්, ලොකයාටත්; වැඩ වේය, අභිවෘද්ධියවන්නේය; සඳවැලඳි, චන්ද්‍රාශ්ලෙෂිතවූ; සාවා, සසක්‍යා; දිනෙන්දින, දවසින්දවස; කැටුවම, (චන්ද්‍රයාහා) සමගම; වැඩෙනමෙනි, වැඩෙන්නාක්මෙනි.

202 නිරිඳෙ, නරෙන්ද්‍රයෝතුමූ; පින්පව්කළ, පුණ්‍යාපුණ්‍යකරණලද්දාවූ; සතන්, සත්‍වයන්; දිවසින්දුටුසෙ, දිව්‍යචක්ෂුසින් දර්ශනයක්ලාසේ; දකිත්, දර්ශනයකරත්; වැඩඅවැඩදෙකටම, අර්ථානර්ථදෙකටම; උන්උන්ම, ඔවුන් ඔවුන්ම; සැණෙකින්, ඇසිල්ලකින්; පමුනුවත්, සම්ප්‍රාප්තකරවත්.

203 නිරිඳුන්ට, නරෙන්ද්‍රයන්ට; පිරිදුවූ, විරුද්ධවූ; දනන්හා, ජනයන්හා; දවසරිණ, දවස්යවන්නාවූ; අවියත්, අව්‍යක්තයෝ; මරහට, මාරයාට; අත්සන්කොට, හස්තසංඥාකර; තමකරා, තමන්වෙතට; කැඳවන විලස්වේ, ආමන්ත්‍රණය කරන්නාවැනි වේ.

204 බෝකල්, බොහෝකාලයක්; පුරුදුයයි, පරිචිතයයි; සිතා, චින්තනයකොට; මදකුත්, ස්වල්පයකුත්; අලසනොසිතව්, ආලස්‍යයක් චින්තනය නොකරව්; කිරිදී, ක්ෂීරදානයකොට; ඇතිකළත්, වර්ධනයකළ නමුත්; උරග, නාගයාගේ; විස, විෂය; වෙනසක්, විශෙෂයක් හෝ අඩුවීමක්; නොවේ, නොවන්නේය.

205 සිල්ප, ශාස්ත්‍රයන්ද; උපදෙස්, උපදේශ හෝ ගුරුකම්ද; බස්, (අර්ථදායක ප්‍රිය) වචනයන්ද; අබය, (සමකින් භයක්පැමිනිකල) නිර්භයද යන; මෙසතර, මේ චතුෂ්කය; දෙන, දානයකරන්නාවූ; උතුමෝ, උත්තමයෝ; තමගෙ, තමන්ගේ; පියවූ පියසමග, ප්‍රියවූ පියාන්හා; පස්දෙනම, පචජනයෝම; පියපියවෙත්, ප්‍රියපිතෘහුවෙති.

206 අදහම් නොලා සිත-දහම් නිති මෙහෙයිලා සතරකා,
දවසරිණ දනෝ ලෙව්-දෙලොව සැපවිඳ නිවන් පුරයෙන්.

207 වැඩකට ගත නොහැකි-මිනිසුන් එක්කෙරෙත්නම් කමකට,
වැඩකට නොගන්නා-අබියුත් නැකත එක්කරණ මෙනි.

208 තපසත් වයස කුල-ගුණ නැණ විකුම් ඇමින් වැඩුනත්,
මේ ඇමට වැඩියෙන්-දනවත් දනෝ ලෙව්හි බබලත්.

209 එක බිලයෙකින් නික්මෙන-පිපිලිකාවුන්ගෙ ගණනට,
මුලු දඹදිව දනෝ-නොසරිවෙත් දිවසින් බැලුවත්.

210 කොතරම් තරමැතත්-කිසි ඉල්ලුසඳ දනෝ ලගුවෙත්,
උවිඳු මහබලිගෙන්-බිම් දන් ගනුව කුඩාවූමෙන්.

---

206 අදහම්, අධර්මය; සිත, චිත්තයෙහි; නොලා, නොහෙලා; නිති, නිරන්තරයෙන්: දහම්, ධර්මය; මෙහෙයි, මහාස්හි; ලා, හෙළා; ලෙව්සතරක, ලෝක සත්වයන් රක්‍ෂාකොට; දවසරිණ, දවස් යවන්නාවූ; දනෝ, ජනයෝ; දෙලොව, උභයලෝකයෙහි; සැපවිඳ, සම්පත්වලඳ; නිවන්පුර, නිර්වාණනැමති පුරයට; යෙන්, ගමන්කරත්.

207 වැඩකට, (යම්කිසි) අර්ථයකට; ගත නොහැකි, නොගත හැක්කාවූ; මිනිසුන්, මනුෂ්‍යයන්; කමකට, යම්කිසි කර්මයකට; එක්කෙරෙත් නම්, රැස්කරත් නම්; වැඩකට, (යම්කිසි) නැකැත්යොගයකට; නොගන්නා, නොවගන්නාවූ; අබියුත් නැකත, අභිජිත් නම් නක්‍ෂත්‍රය; එක්කරණමෙනි, එක්කරන්නා සමානයි.

208 තපසත්, තාපන කර්මයද; වයස, යෞවනකාලයෙහි දැනිමිනි වයසද; කුල, වංශයද; ගුණනැණ, ගුණ ඥානයද; විකුම්, වික්‍රමය ද යන; ඇමින්, මෙසියල්ලෙන්; වැඩුනත්, වර්ධිත වුවත්; මේඇමටම වැඩියෙන්, මේ සියල්ලටම වැඩිකොට; දනවත් දනෝ, ධනවන්තයෝ; ලෙව්හි, ලෝකයෙහි; බබලත්, භ්‍රාජිතවෙත්.

209 එකබිලයෙකින්, එකනමකොටරයකින්(හෙවත්) සිදුරකින්; නික්මෙන, නිෂ්ක්‍රාන්තවන්නාවූ; පිපිලිකාවුන්ගෙ, කුහුඹුවන්ගේ; ගණනට, සංඛ්‍යාවට; දිවසින්බැලුවත්, දිව්‍යචක්‍ෂුසින් නිරීක්‍ෂණයකළත්; මුලුදඹදිව දනෝ, සියලුජම්බුද්වීපවාසී ජනයෝ; නොසරිවෙත්, සමාන නොවෙත්.

210 කොතරම්, කොපමණ (උතුම්වූහෝ මහත්වූ); තරම්ඇතත්, ප්‍රමාණය ඇත්නමුත්; කිසි, යම්කිසිවස්තුවක්; ඉල්ලුසඳ, යාචනය කළ කල්හි; දනෝ; ජනයෝ; ලගුවෙත්, සැහැල්ලුවෙත්; උවිඳු, විෂ්ණුතෙමේ; මහ බලිගෙන්, මහාබලිඅසුරයාගෙන්; බිම්, භූමිය; දන්ගනුව, දානග්‍රහණයට; කුඩාවූමෙනි, කුරුවූවාසේයි.

211 එක යහපතක් කළ-සුදනෝ වැරදි සියයක් ඉවසත්,
දුදනෝ නොමද වැඩ-කළත් එකවරදක බිදීයෙත්.

212 ලුහුදන නොදනිතත්-සුදන දැනගණිත් සුදනන්ගුණ,
අඟුරෙහි මැදතුබූ-රුවන් දැනගත් නැණැතියන්සේ.

213 දුන් දේ මේ ලොවම-ලැබේ පියතුනි නෑගි පෙරළී,
දුන් ලුණඹ වැස්සෙන්-ලෙව්රැක නැවත සිඳු වදිනමෙනී.

214 උතුමන් සෙවුන්'කළ-නොමද සව්ඉසුරු ලැබේ නිති,
මෙරහැසිරැ හිය හැම-සතුන් එම පැහැය වන විලස්සේ.

215 තදරුදු ගුණැතියන්-සමග විසුවත් සුදනො නොනැසෙත්,
කුරිරුගිනි මැදපත්-පවන නොනසින විලස මෙන් වේ.

---

211 එකයහපතක්, එකම යහපත්කමක්; කළ, (අන්‍යයන්විසින්) කරණු ලැබූකල්හි; සුදනෝ, සත්පුරුෂයෝ; වැරදි, වද්‍ය; සියයක්, ශතයක්; ඉවසත්, ක්‍ෂමාකරත්; නොමද, බොහෝවූ; වැඩ, ඇඩ; කළත්, කළේනමුත්; දුදනෝ, දුජිනයෝ; එකවරදක, එකම්වැරද්දකින්; බිදියෙත්, හෙදව යත්.

212 ලුහුදන, ලඝුජනයෝ; නොදනිතත්, නොදන්නෝනමුත්; සුදනන්ගුණ, සත්පුරුෂයන්ගේ ගුණයන්; සුදන, සත්පුරුෂයෝ; දැනගණිත්, විජානනයකරත්; අඟුරෙහි මැද, පාෂාණමධ්‍යයෙහි; තුබූ, තිබුනාවූ; රුවන්, රන්; නැණැතියන්, ඥනවන්තයන්විසින්; දැනගත්සේ, විජානනය කළාමෙනි.

213 පියතුනි, ව්‍යක්තයෙනි; දුන් දේ, දානයකළවස්තුව; පෙරළී, පරිවර්තනවී; මේලොවම, මේලොකයෙහිදීම; නෑගි, පඬුරු; ලැබේ, ලැබෙන්නේය; ලුණඹ, ලවණජලය කරණකොටගෙණ; දුන්, උපන්නාවූ; වැස්සෙන්, වර්ෂායෙන්; ලෙව්රැක, ලොකයාරක්‍ෂාකොට; නැවත, දෙවැනිව; සිඳු, සමුද්‍රයට; වදිනමෙනි, ප්‍රවිෂ්ටවන්නාසේයි.

214 උතුමන්, උත්තමයන්; සෙවුන්කළ, සෙවනයකළහොත්; නිති, නිරන්තරයෙන්; නොමද, බොහෝවූ; සව්ඉසුරු, සකලෛශ්වර්‍ය්‍යයී; ලැබේ, ලාභවෙයි; මෙර; මෙරුපර්වත; හැසිරැගිය; ආශ්‍රයට පැමිනියාවූ; හැමසතුන්, සියලුමසත්වයන්; එමපැහැය, එමස්වර්ණප්‍රභාව; වන්නාවිලස්සේ, වන්නාවූ ආකාරය මෙනි.

215 තදරුදු, ඉතාරෞද්‍රවූ; ගුණැතියන්සමග, ගුණඇත්තන්හා (හෙවත්) ඉතාරෞද්‍රයන්හා; විසුවත්, වාසයකළ නමුත්; සුදනෝ, සත්ජනයෝ; නොනැසෙත්, සත්ගුණවිනාශයට නොපැමිනෙත්; කුරිරු, කෲරවූ; ගිනිමැදපත්, වහ්නිමධ්‍යයටපැමිනියාවූ; පවන, මාරුතය; නොනසිනවිලසමෙන් වේ, නොනස්නා ආකාරය මෙනි.

216 තමහට වරදකල–දුදනන්ට වෛර නොබැඳ කැරැ මෙත්,
වඩා වැඩ කරව් සිදු–එව්හු විලිබියට පැමිනෙන සේ.

217 කුසුම් හි නොපවති–නොමද තදසුවඳ රිසිවනදන,
එමෙන් දන සුසිරිත–නොමැත තුනු ගැරඬිකුන වැනිවේ.

218 පෙර පින් නොකොට දූන්–සැපතට සැපෙන අවියත් දනෝ,
නොවපුට බිජු කෙතේ–දන මඬිනවුන් දූක තැවෙනුවෝ.

219 ලොව කළමනා දෙය–නොදූන කළහොත් නොපණත්,
වැනසෙනු නියතමයි–අහසට දූමූ කැටක් හෙනවිලසින්.

220 අවසෙසු දනෝ ලද–නොමද ඉසුරක් අමුත්තක් වේ.
දුඹුලුදිය දිවනැඟි–මසු වැනසෙන ලෙසට වැනසෙති.

---

216 තමහට, තමන්ට; වරදකල, වැරදිකළාවූ; දුදනන්ට, දුර්ජනයන්ට; වෛර නොබැඳ, වෛරබන්ධනය නොකොට; මෙත්කැරැ, මෛත්‍රීකොට; එව්හු, ඒ දුර්ජනයෝ; විලිබියට, ලජ්ජාභයට; පැමිනෙනසේ, සම්ප්‍රාප්තවන පරිද්දෙන්; වඩාවැඩ, වැඩියක් අභියන්; සිදුකරව්, සිද්ධකරව්.

217 කුසුම්, පුෂ්පයන්; හී, (පරව) වැටුනකල; දනරිසිවන, ජනයන් රිසිවන්නාවූ; නොමද, බොහෝවූ; තදසුවඳ, දැඩිසුගන්ධය; නොපවති, නොපවතින්නේය; එමෙන්, එපරිද්දෙන්ම; දන, ජනයාගේ; සුසිරිත, සුචරිතධර්මය; නොමැත, නැතහොත්; තුනු, ශරීරය; ගැරඬිකුන වැනිවේ, ගැරඬිකුනපයක් සමානවෙයි.

218 පෙර, පූර්ව (ජාති) යෙහි; පින් නොකොට, පුණ්‍යකර්ම නොකර; දූන්, මේ කාලයෙහි; සැපතට, සම්පත් පිණිස; සැපෙන, ගැටෙන්නාවූ (හෙවත්) උත්සාහකරන්නාවූ; අවියත් දනෝ, අව්‍යක්තජනයෝ; කෙතේ, ක්ෂේත්‍රයෙහි; බිජු, ධාන්‍යය; නොවපුට, නොවපුරා; දනමඬිනවුන්, ධාන්‍යමඬින්නන් (හෙවත්) කොළදින් කරන්නන්; දූක, නිරීක්ෂණයකොට; තැවෙනුවෝ, තාප වන්නෝයි.

219 ලොව, ලොකයෙහි; කළමනා දෙය, කටයුතුදේ; නොදූන, දූනීම් නැතිව; නොපණත්, අනඩුහෝ අයුතු; කළහොත්, කෙළේවීනම්; වැනසෙනු, විනාශවීම; නියතමයි, නිශ්චයමැයි; අහසට, ආකාශයට; දූමූ, ප්‍රක්ෂෙප කළාවූ; කැටක්, කැටයක් හෝ කුඩා ගලක්; හෙනවිලසින්, පතිත වන්නාමෙනි.

220 අවසෙසු, අවශේෂවූ හෝ ස්වල්පවූ; දනෝ, ජනයෝ; නොමද ඉසුරක්, අමන්දවූ ඓශ්වර්යයක්; ලද, ලැබුයේනම්; අමුත්තක්, අමු

221 කළ අල්ප පිණෙනුත්-නොමද සුරනර සැපත් පැමිණේ,
නුගබිජුවටින් නැගි-විසල් තුර සා මඩුලු වනමෙනි.

222 තිරසර ගුණැතිසත-සව්සතට මැදහත්ව පවතී,
මහමෙර සුර අසුර-දෙලොවට සමව සැදීසිටිනෙව්.

223 සහසික පව්වුදන-මළකල ගෙණයේය නිරයට,
පහන නිවිසදෙහිම-මුලුගෙය අඳුරු වැසෙන විලසිනි.

224 නොතළා කුසුම් රොන්-ගන්නා බිඟුන් අයුරෙන්,
නොතළා ලොව සතන්-අයබදු ගණුත් ඉදලෝ වැඩවේ.

225 ඇසිරුවන් සතහට-දුක්විය නොදෙත් තම නැසෙතත්,
රාවණ තම මලුට-අලකොත පලන් මතදූරු මෙනි.

---

ත්‍රු සවභාවක් හෝ නොබිඳීමක්; වේ, වන්නේය; දුඹුලුදියදිට, දුඹිල වූ (නොහොත්) අලුත්වූ දියපාර දක; නැගී, උල්ලඞ්ඝනයවූ; මසු, මත්ස්‍යයෝ; වැනසෙනලෙසට, විනාශ වන ආකාරයට; වැනසෙති, (යථොක්ත ජනයෝ) විනාශවෙත්.

221 කළ, (කිසිවක්හුවිසින්) කරණලද්දවූ; අල්ප පිණෙනුත්, සවල්පපුණ්‍යකර්මයෙනුත්; නොමද, බොහෝවූ; සුරනරසැපත්, දෙව්මිනිස් සම්පත්තිය; පැමිණේ, සම්ප්‍රාප්තවේ; නුගබිජුවටින්, න්‍යග්‍රොධබීජයෙන්; නැගී, හටගත්තාවූ; තුර, වෘක්ෂය; විසල්, විශාලවූ; සාමඬුලු, ශාඛාමණ්ඩලයන්ඇත්තේ; වනමෙනි, වන්නාමෙනි.

222 තිරසර, ස්ථිරසාරවූ; ගුණැති සත, ගුණ ඇත්තාවූ සත්ත්වතෙම; සව්සතට, සියලුසත්ත්වයන්ට; මැදහත්ව, මධ්‍යස්ථව; පවතී; ප්‍රවර්ත්තිත වෙයි; සුරඅසුර දෙලොවට, සුරාසුරලොකද්වයට; සමව, සමානව; මහමෙර, මහාමෙරුව; සැදී, පිහිටා; සිටිනඑව්, සිටින්නාමෙනි.

223 සහසික, (පාපිෂ්ඨක්‍රියායෙන්) බලාත්කාර කරණ; පව්වුදන, පාපාධිකජනයෝ, මළකල, මැරුණකල්හි; නිරයට, අපායට; ගෙණයේය, ගෙණයයි; පහන, ප්‍රදීපය; නිවිසදෙහිම, නිවීගිය ඇසිල්ලෙහිම; මුලුගෙය, සියලුගෘහයම; අඳුරු, අන්ධකාරයෙන්; වැසෙන විලසිනි, වැසෙන්නාමෙනි.

224 කුසුම්, පුෂ්පයන්; නොතළා, තාඩනයනොකොට; රොන්, රේණුන්; ගන්නා, ග්‍රහණයකරන්නාවූ; බිඟුන්අයුරෙන්, භෘඞ්ගයන් පරිද්දෙන්; ලොවසතන්, ලොකසත්ත්වයන්; නොතළා, පීඩාවට නොපමුනුවා; අයබදුගණුත්, (රජදරුවන්විසින්) සුංකම්ගන්නාලද්දේ නමුත්; දෙලෝවැඩ, උභයලොකාර්ථය; වේ, වන්නේය.

225 ඇසිරුවන්, ආශ්‍රයටපැමිනියාවූ; සතහට, සත්ත්වයන්ට; තම

226 දුරුකර දුදනයන්-සුදන සමගව කර දෙලෝවැඩ,
අපමණ ඉසුරු තෙද-විකුම් නැණැ තත් මැකේ මරණින්.

227 තෙදැති නිරිඳුන් දික්-විජය නොකළත් පවති අණසක,
සුරපුර ඉඳත් ඉඳු-දසදිගත එකසේ තෙව්නමෙන්.

228 සරාකල පුන්සඳ-කිරණින් ගුවන බබලනමෙන්,
නිරිඳෝ මැතිවරුන්-මැදහත්කමින් ලෙව්හි බබලත්.

229 දිවිමුත් තදසතුරු-බිය පව් අසන නොමද නුගුණත්,
මෙකී සිව් අවැඩව-පරගන සෙවිනහට පැමිනේ.

230 නුපයා සව්සිරි-දුගීලුහුදන දන අඹු සොඬකම්,
අවයත්වැ පඬිබැව්-පානෙ නැණනැති දද දනෝවෙත්.

---

නැසෙතත්, තමන්විනාශවන්නේනමුත්; දුක්වියනොදෙති, දුක්වීමට (කරුණාවන්තයෝ) අවකාශනොදෙත්; රාවණ, රාවණාවිසින් තමමලුට, තමන් මලයාට; අලකොතපලන්, ගෘහශෘඞගාභරණයන්; මත, මස්තකයෙහි; දූරුමෙනි, ධාරිත කළාක්සමාතය.

226 දුදනයන්, දුර්ජනයන්; දුරුකර, පහකොට; සුදනසමගව, සජ්ජනයන්එකතුව; දෙලෝවැඩ, උභයලොකාර්ථයන්; කර, කරලා; අපමණ, අප්‍රමාණවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යද; තෙදවිකුම්, තෙජස් හා වික්‍රමද; නැණ, ඥානයද; ඇතත්, ඇත්නමුත්; මරණින්, මරණයපැමිනීමෙන්, මැකේ, මේසියල්ලම මැකීයේ.

227 තෙදැති, තෙජස්ඇත්තාවූ; නිරිඳුන්, නරෙන්ද්‍රයන් විසින්; දික්විජය, දිශාජයග්‍රහණය; නොකළත්, නොකරණලදනමුත්; අණසක, ආඥාචක්‍රය; පවති, පවත්නේය; ඉඳු, ශක්‍රතෙමේ; සුරපුර, දිව්‍යපුරයෙහි; ඉඳත්, වාසයකරමිනුත්; එකසේ, එකාකාරයෙන්; දසදිගත, දශදිගාන්තයෙහි; තෙව්න මෙන්, බබලන්නාමෙනි.

228 සරාකල, ශරත්කාලයෙහි; පුන්සඳ, පූර්ණචන්ද්‍රයා; කිරණින්, කාන්තියෙන්; ගුවන, ආකාශයෙහි; බබලනමෙන්, බබලන්නාසේ; මැතිවරුන්, මන්ත්‍රීවරයන්ගේ; මැදහත්කමින්, මධ්‍යස්ථකම කරණකොටගෙණ; ලෙව්හි, ලොකයෙහි; නිරිඳෝ, නරෙන්ද්‍රයෝ; බබලත්, භ්‍රාජිතවෙත්.

229 දිවිමුත්, ජීවිතමිදීම (හෙවත්) ජීවිතවිනාශයද; තදසතුරුබිය, දැඩිසතුරන්ගෙන්වන භයද; පව්, පාපයද; නොමද, බොහෝකොට; අසන, ශ්‍රවණයකරන්නාවූ; නුගුණත්, අගුණහෝ අපකීර්තියදයන; මෙකී, මෙකියනලද්දාවූ; සිව්අවැඩම, සතරවැදෑරුම්වූ අනර්ථයන්ම; පරගන, පරස්ත්‍රීන්; සෙවිනහට, සෙවනයකරන්නාට; පැමිනේ, සම්ප්‍රාප්තවේ.

230 සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යය; නුපයා, නූපදවා; දුගී, දිළිඳුජන

231 සක්විති රජ ඉසුරු-සරිකරන දෙව්ලොවෙක සිරි,
නස්නා පහන සම-කළ සව්සිරි රුවන් රන්වැනි.

232 මෙබඳු සුරපුරවත්-දඹදිවම වැඩි පින්කෙත්,
මතුනොවේ මුනිවර-මෙහිපිද බුදුව මොක් දෙනුවෝ.

233 සුදනන්ට කළවැඩ-පලනොදෙයි යන සැකය නොසිතව්,
නෙරළුපැලයට ඇදි-දියව පල ගෙණ දෙන විලසවේ.

234 අගහිට මුලවලක්-කනවැනිසුදනන්ගෙ ඉතකම්,
දුදනන් සමගවනු-එහිමුලපටන් අගට බිඳිනෙව්.

---

යාගේ; දන, වස්තුවකෙරෙහිද; ලුහුදන, ලඝුජනයාගේ, අඹු, භාර්‍ය්‍යාවකෙරෙහිද; සොඬකම්, ලොභකිරීමද; අව්යත්වැ, අව්‍යක්තව; පඬිබැව්, පණ්ඩිතභාවය; පාතේ, ප්‍රකාශකරන්නේද; නැණනැති, නුවණනැත්තාවූ; දද දනෝ වෙත්, ජඩමිනිස්සු වෙති.

231 සක්විතිරජ, චක්‍රවර්තිරජහුගේ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; දෙව්ලොවෙකසිරි, දිව්‍යලොකයක සම්පත්හා; සරිකරත, සමානකරත්හොත්; නස්නාපහන, නිකෂපාෂාණයහා; සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යයද; රුවන්රන්, (මාණික්‍යාදි) රත්නහා සුවර්ණයන්; සමකළවැනි, සමානකළාක්මෙනි.

232 මෙබඳු, මෙයාකාරවූ; සුරපුරටත්, දිව්‍යලොකයටත්වඩා; දඹදිවම, ජම්බුද්වීපයම; වැඩිපින්කෙත්, අධිකපුණ්‍යක්ෂෙත්‍රයි; මෙහි, මේ ජම්බුද්වීපයෙහි; මුනිවර, බුද්ධවරයෝ; ඉපිද, උත්පත්තිව; බුදුව, බුදුවී; මොක්දෙනුවෝ, මොක්ෂදානයකරන්නෝ (හෙවත්) නිවන්ගෙණ දෙනුවෝ; මතුනොවේ, මේවර්තමානකාලයෙහිම පමණක් නොවන්නේය.

233 සුදනන්ට, සත්පුරුෂයන්ට; කළ, කරණලද්දාවූ; වැඩ, අර්ථසිද්ධියෙන්; පලනොදෙයියන, විපාකදානයනොකරන්නේයයියන; සැකය, සංසය; නොසිතව්, නොවිතර්කනයකරව්; නෙරළුපැලයට, නාලිකෙරගච්ඡයට (හෙවත්) පොල්පැලයටවූ; ඇදිදියව,'ඇද්දාවූජලය පිණිස හෝ සිලව්වට; පලගෙණ, ඵලග්‍රහණයකොට; දෙනවිලසවේ, දානයකරන්නාමෙනි.

234 සුදනන්ගෙ, සුජනයන්ගේ; ඉතකම්, හිතෛෂීක්‍රියා; අගහිට මුලට, අගපටන් මුලදක්වා; උක්කනවැනි, ඉක්ෂුභක්ෂණය සමානයි; දුදනන්, දුර්ජනයන්හා; සමගවනු, එකතුවීම; එහි, එමඋක්ගසෙහි; මුලපටන්අගට, මුලහිටඅගදක්වා; බිඳිනෙව්, භක්ෂණයවැනියි.

235 නොයෙක්කටයුතුකම්-දන්නාලෙසට ලොව නැණැතිව්,
නොයෙක් උපමායෙන්-සැදූ නිරතුරු බලා ගැණුමට.

236 අනුවණ දුරැරසැප-වාසයකර මෙලොව නිරතුරෙන්.
සගමොක් සැපත්ලැබ-ගන්ට බලව් ලෝකෝපකාරය.

237 සිරිසර ගුණැති මහ-නැණ තෙදිනි පරසිදුව සිටි,
සිරිපිරි තොටගමුවෙ-වෙහෙර බොහොසෙකල් හැරවැඩසිටි.

238 කෙළවරකලෙ මෙපොත-පුරසත්‍යසකවස පිරිසිටි,
පරපුර වණිජකුල-රනස්ගලුතෙරසාමින්.

---

235-236 නැණැතිවී, ඥානවන්තව; ලොව, ලොකයෙහි; නොයෙක්කටයුතුකම්, අනෙකප්‍රකාර කටයුතු කර්ම; දන්නාලෙසට, දැනගන්නාආකාරයට (ද); නිරතුරෙන්, නිරන්තරයෙන්; අනුවණ, අඥානකම්; දුරැර, දුරලා; මෙලොව, මේලොකයෙහි; සැපවාසයකර, සැපවිහරණකොට; සගමොක්සැපත්, ස්වර්ගමොක්ෂසම්පත්තියත්; ලැබගන්ට, ලැබගන්නාපිණිස; නිරතුරු, නිරන්තරයෙන්; බලාගැණුමට, බලාගන්නාපිණිස; නොයෙක් උපමායෙන්, අනෙකොපමායෙන්; සැදූ, සැරහුවාවූ (හෙවත්) සැදුවාවූ; ලෝකෝපකාරය, ලොකොපකාරනම්වූ මෙප්‍රකරණය; බලව්, නිරීක්ෂණයකරව්.

237 සිරිසර, ශ්‍රීයෙන්සාරවූ; සිරිපිරි, ශ්‍රීයෙන්හෝ ඓශ්වර්‍ය්‍යයෙන්පිරුණාවූ; තොටගමුවෙ වෙහෙර, තීර්ථග්‍රාමවිහාරයෙහි; බොහොසෙ, වැඩිවසයෙන්; කල්හැර, කාලාතික්‍රමණයකරමින්; වැඩසිටි, වැඩසිටියාවූ; මහගුණැති, මහත්ගුණඇත්තාවූ; නැණතෙදිනි, ඥානයෙන්හා තෙජසින්; පරසිදුවසිටි, ප්‍රසිද්ධවසිටියාවූ.

238 පරපුර වණිජකුල, වංශයෙන්වෙළඳකුලඇති; රනස්ගලුතෙර සාමින්, රනස්ගලු ස්ථවිරසාමීන් විසින්; මෙපොත, මේ පුස්තකය; සකවස, ශකරාජවර්ෂයෙන්; පුරසත්‍ය, පුරසත්‍යනම් වර්ෂයෙහි හෙවත් 1721 වැනි වර්ෂය; පිරිසිටි, සම්පූර්ණවසිටිකල; කෙළවරකලෙ, නිෂ්ඨාකළේයි.

නිමි.